

වාර්ෂික කාර්ය සාධන වාර්තාව

வருடாந்திர செயல்திறன் அறிக்கை

Annual Performance Report

2022

ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව

தேசிய சமூக நீர் வழங்கல் திணைக்களம்

Deprtment of National Community Water Supply

ජලසම්පාදන හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය

நீர் வழங்கல் மற்றும் தோட்ட உட்கட்டமைப்பு அபிவிருத்தி அமைச்சு

Ministry of Water Supply and Estate Infrastructure Development

2022 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව
ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව
වැය ශීර්ෂ අංකය 332

අන්තර්ගතය

පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

පරිච්ඡේදය 02 – ප්‍රගතිය හා ඉදිරි දැක්ම

පරිච්ඡේදය 03 - වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය

පරිච්ඡේදය 04 – කාර්ය සාධන දර්ශක

පරිච්ඡේදය 05- තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ

පරිච්ඡේදය 07– අනුකූලතා වාර්තාව

01 පරිච්ඡේදය

ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1. හැඳින්වීම

ප්‍රජාවට සුරක්ෂිත පානීය ජලය ලබාදීමේ අරමුණ පෙරදැරිව දශක හතර කට ආසන්න කාලයක් විවිධ වැඩසටහන් යටතේ ක්‍රියාත්මක කොට ප්‍රජාවට භාර කරන ලද ප්‍රජා ජල ව්‍යාපෘති වල පරිපාලන කළමනාකරණ හා විවිධ ගැටළු නිසාවෙන් එම ව්‍යාපෘති වල තිරසාර පැවැත්ම අභියෝගයකට ලක්වූ මොහොතක 2014 වසරේ සැප්තැම්බර් මස 19 වැනි දින සිට බලාත්මක වන ලෙස ප්‍රජා ජල ව්‍යාපෘති නියාමනය කිරීමේ අරමුණ පෙරදැරිව ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව ස්ථාපිත කරන ලදී.

ආසියානු සංවර්ධන බැංකුව , ලෝක බැංකුව , DANIDA , FINNIDA වැනි ජාත්‍යන්තර සංවිධාන වල පූර්ණ අනුග්‍රහය හා මූල්‍ය දායකත්වය මත ශ්‍රී ලංකා ජනරජය සමග එළඹගත් ගිවිසුම් ප්‍රකාරව දිවයින පුරා මෙලෙස ක්‍රියාවට නංවා ප්‍රජාවට භාර කරන ලද ප්‍රජා ජල ව්‍යාපෘති සංඛ්‍යාව 5000 කට ආසන්නව පැවතිනි.

විවිධ ගැටළු නිසාවෙන් මෙලෙස ආරම්භ කරන ලද ව්‍යාපෘති අතුරින් ප්‍රජා ජල ව්‍යාපෘති 500 කට ආසන්න ප්‍රමාණයක් 2010 වර්ෂය වන විට අකර්මන්‍ය වීමේ අවධානමකට ලක්විණි . මේ බව මනාව තේරුම් ගනිමින් එවකට පැවති රජය එම තත්වය වලක්වා ප්‍රජා ජල ව්‍යාපෘති වල තිරසර භාවය තහවුරු කිරීම උදෙසා ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව ස්ථාපිත කරන ලදී.

2014 වර්ෂයේ අග භාගයේ මෙම දෙපාර්තමේන්තුව ස්ථාපිත කරනු ලැබුවත් දෙපාර්තමේන්තුවට අවශ්‍ය නිලධාරීන් බඳවා ගැනීම සඳහා බඳවා ගැනීමේ පටිපාටීන් අනුමත කර ගැනීම, කාර්ය මණ්ඩල පත් කිරීම, ප්‍රධාන කාර්යාලය හා දිස්ත්‍රික් කාර්යාල ස්ථාපිත කිරීම ඉතා මන්දගාමීව සිදුවීම වැනි හේතු නිසා මහා භාණ්ඩාගාරයෙන් මේ සඳහා වෙන් කරනු ලැබූ ප්‍රතිපාදන ප්‍රමාණයද වාර්ෂිකව රුපියල් මිලියන 100 කටත් වඩා අඩු අගයක් ගැනීම, එහි කාර්ය භාරය ඉදිරියට ගෙන යාමට ප්‍රබල බාධාවක්ව පැවතිණි.

2019 වර්ෂය වන විට මෙම අභියෝග ජය ගනිමින් පවත්නා ජල ව්‍යාපෘති හා ප්‍රජා මූල සංවිධාන නියාමනයෙන් ඔබ්බට ගොස් නව ජල ව්‍යාපෘතිද ආරම්භ කරමින් වඩාත් ග්‍රාමීය ප්‍රජාවට සුවිශේෂී සේවාවක් හා කාර්ය භාරයක් ඉටු කරන දෙපාර්තමේන්තුවක් බවට පත්කිරීම සඳහා එහි කාර්යභාරය තව දුරටත් පුළුල් කෙරිණි."ප්‍රජා ජල අභිමානී " නමින් වැඩසටහනක් හඳුන්වා එමගින් නව ගම්මාන රැසකට සුරක්ෂිත පානීය ජලය ලබාදීම හා අඛණ්ඩව එම වැඩසටහන ඉදිරියට ගෙනයාම මෙහිලා විශේෂයෙන් සඳහන් කල යුතුය .

වාර්ෂිකව රු. මිලියන 100 කටත් වඩා අඩු ප්‍රතිපාදන යටතේ වසර 5 කටත් අධික කාලයක් ඉතා මන්දගාමීව ක්‍රියාත්මක වූ මෙම දෙපාර්තමේන්තුවට ඉහත සඳහන් කරන ලද අභියෝග ජයගැනීම නිසාවෙන්ම 2019 වර්ෂයේ සිට රුපියල් මිලියන 1500 කට වඩා වැඩි ප්‍රතිපාදන ප්‍රමාණයක් ශ්‍රී ලංකා රජයේ වාර්ෂික අයවැයෙන් අඛණ්ඩව වෙන් කරන ලදී. මෙලෙස දෙපාර්තමේන්තුවේ කාර්ය භාරය පුළුල් කිරීමට කටයුතු කරමින් පවතින මොහොතක විශේෂයෙන්ම 2021 හා 2022 වර්ෂ, කොරෝනා ව්‍යසනය හේතුවෙන් සමස්ථ ලෝක ආර්ථිකයම දැවැන්ත පසුබෑමකට ලක්වූ අතර අප ආර්ථිකයටද ඉන් ඇතිකරන ලද බලපෑම අතිමහත්ය.කොරෝනා ව්‍යසනය යම්තාක් දුරකට පාලනය කල හැකි වුවත් තවදුරටත් එමගින් ජනිත කරන ලද ආර්ථික ව්‍යසනයෙන් ගොඩඒමට අප ආර්ථිකය ඇතුළු බොහෝ ආර්ථිකයන් අසමත් වී ඇත.

විශේෂයෙන්ම 2022 වර්ෂය කොරෝනා ව්‍යසනයෙන් අකර්මන්‍ය වූ අප ආර්ථිකය ලෝක ආර්ථික ප්‍රවණතා , විශේෂයෙන් ආර්ථික අර්බුධයන් හමුවේ තවදුරටත් අකර්මන්‍ය වූ අතර මෙරට සංවර්ධන ක්‍රියාවලියේ ජව සම්පන්නව ක්‍රියාත්මක වූ පානීය ජල සැපයුම් ක්ෂේත්‍රයද දැඩි අවධානමකට ලක්විණි.කාලාන්තරයක් තිස්සේ අප ආර්ථිකය වෙලාගෙන සිටි ණය අර්බුධය ඉතිහාසයේ උච්චතම අවස්ථාවට පත්වූ වර්ෂය ලෙසද 2022 වර්ෂය ලෙස සඳහන් කල යුතුය .

මෙම ආර්ථික අර්බුධයෙන් ගොඩ ඒම සඳහා විවිධ ක්‍රමෝපායන් රජය විසින් හඳුන්වා දී ඇති අතර, දේශපාලන අස්ථාවරභාවය , රට බංකොලොත් රාජ්‍යයක් බවට ප්‍රකාශයට පත් කිරීම වැනි හේතු නිසාවෙන් සංවර්ධන වැඩසටහන් වල ප්‍රමුඛතාවන්ද දැවැන්ත අභියෝගයකට ලක් කෙරිණි. වාර්ෂිකව අයවැයෙන්

වෙන්කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය 50% කින් කපා හැරිණි.භාණ්ඩ හා සේවාවල මිල අඛණ්ඩව ඉහල යාම හමුවේ අධි උද්ධමනකාරී තත්වයක් රට තුල නිර්මාණය වූ අතර, සමස්ත ආර්ථිකයම දැඩි අර්බුධකාරී තත්වයකට පත්විය. විශේෂයෙන්ම, ඉදිකිරීම් ක්ෂේත්‍රය දැවැන්ත කඩා වැටීමකට ලක්විණි. මේ තත්වය ප්‍රජා ජල ව්‍යාපෘති වලටද ඉතාමත් අහිතකර ලෙස බලපෑම් කල අතර පවත්නා අභියෝග වලට සාර්ථකව මුහුණ දෙමින් අඛණ්ඩව දෙපාර්තමේන්තුවෙන් අපේක්ෂිත කාර්යභාරය ලභා කරගැනීම උදෙසා විවිධ උපායමාර්ගයන් භාවිත කරන ලදී.

වර්තමානය වන විට ශ්‍රී ලංකාවේ නල ජල ආවරණය 59.76%ක් වන අතර ඉන් 12.37%ක් ආවරණය වන්නේ ප්‍රජා ජල ව්‍යාපෘති මඟිනි. ජල ව්‍යාපෘති 4,285 මඟින් ගම්මාන 5,000කටත් වඩා වැඩි 722,065 ක් තරම් වූ පවුල් සංඛ්‍යාවක් මෙමඟින් තම පානීය ජල අවශ්‍යතා සපුරා ගන්නා අතර සමස්ථ ප්‍රතිලාභී සංඛ්‍යාව ගත්විට තිස්පන් ලක්ෂය ඉක්මවූ ජනතාවකට මෙමඟින් සෙත සැලසේ.

2021 වර්ෂය මෙරට ආර්ථිකය දැවැන්ත අභියෝග රැසකට හා අර්බුධ ගණනාවකට මුහුණ දුන් කාලයක් ලෙස ඉතිහාසයට එකතුවන අතර, එවැනි අභියෝග හමුවේ වුවද 2022 වර්ෂයේ පවුල් දසදහසකට ආසන්න පිරිසකට (9,429) නව ජල සම්බන්ධතා ලබා දීමට හැකියාව ලැබීම අප ලද ජයග්‍රහණයක් ලෙස මෙහිලා සනිටුහන් කළ යුතුය.

එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් තම සාමාජික රටවලින් අත්පත් කර ගැනීමට අපේක්ෂා කරන ලද තිරසාර සංවර්ධන අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා විශේෂයෙන්ම ජනතාවට සුරක්ෂිත පානීය ජලය ලබාදීම සඳහා දෙපාර්තමේන්තුවේ උපරිම කැපවීම හා මැදිහත්වීම 2022 වර්ෂයේ සිදුකල ආකාරය හා කාර්යභාරය මෙම වාර්තාව තුල සම්පිණ්ඩනය කොට දක්වා ඇත.

1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

දැක්ම

සුරක්ෂිත ජලය සහ සනීපාරක්ෂාව සහිත සෞභාග්‍යමත් රටක්

මෙහෙවර

සෞභාග්‍යමත් ශ්‍රී ලංකාවක් බිහිකිරීමේ භාරදූර කාර්යයයේ ප්‍රධාන කොටස්කරුවෙකු ලෙස ශ්‍රී ලාංකික ජනතාවගේ ජල හා සනීපාරක්ෂක අවශ්‍යතා සැපිරීම සඳහා ප්‍රජා ජල යෝජනා ක්‍රම හා සනීපාරක්ෂාව සංවර්ධනය, ප්‍රජා ජල සංවිධාන බල ගැන්වීම හා නියාමනය, ජල මූලාශ්‍ර හා පරිසර සංවර්ධනය, දෙපාර්තමේන්තුවේ ධාරිතා සංවර්ධනය යන කටයුතු අදාල සියළු පාර්ශවකරුවන්ගේ මනා සහභාගිත්වයෙන් හා විනිවිදභාවයෙන් යුක්තව ක්‍රියාවට නැංවීම.

අරමුණු

- ග්‍රාමීය ප්‍රජාවට පානීය ජලය සපයන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි ප්‍රජාමූල සංවිධාන 4500 කට ආසන්න සංඛ්‍යාවක් නියාමනය කිරීම.
- ග්‍රාමීය ජනතාවට සුරක්ෂිත පානීය ජලය සහතික කිරීම.
- ග්‍රාමීය ජනතාවගේ සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම
- රටේ සමාජ ආර්ථික සංවර්ධනය සඳහා ග්‍රාමීය ජනතාවගේ ක්‍රියාකාරී සහභාගීත්වය යොදා ගැනීම
- සුරක්ෂිත පානීය ජලය සහ යහපත් සනීපාරක්ෂක පුරුදු ඇති කිරීමෙන් රජයට දැරීමට සිදුවන වැය බර අඩුකිරීම
- මානව සම්පත් සංවර්ධනය

1.3. ප්‍රධාන කාර්යයන්

1. ග්‍රාමීය ජල සම්පාදන හා සනීපාරක්ෂක ක්ෂේත්‍රයට අදාල ජාතික ප්‍රතිපත්ති සකස් කිරීම හා යාවත්කාලීන කිරීම සඳහා සහය වීම.
2. ප්‍රජා මූල සංවිධාන සඳහා ව්‍යවස්ථා හා ගිවිසුම් සම්පාදනය කිරීම.
3. ප්‍රජා මූල සංවිධාන විසින් කරනු ලබන ඉදිකිරීම්, ජල යෝජනා ක්‍රමවල නඩත්තු කටයුතු කළමනාකරණය හා අවශ්‍ය අවස්ථා වලදී තාක්ෂණ සහය ලබා දීම.
4. ප්‍රජා මූල සංවිධාන කාර්ය භාරය පහසු කිරීම සඳහා විවිධ මට්ටම්වලදී අදාළ රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන සමඟ සම්බන්ධීකරණය.
5. ප්‍රජා මූල සංවිධානවල ජල ගාස්තු අය ක්‍රම වඩාත් සාධාරණව හා ක්‍රමවත්ව සකස් කර පවත්වාගෙන යාමට අදාළ නිර්නායක හඳුන්වාදීම හා අධීක්ෂනය.
6. ප්‍රජා මූල සංවිධානවල මූල්‍ය කළමනාකරණය මූල්‍ය විනයක් සහිතවවිධිමත්ව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය සහය ලබා දීම හා නියාමනය කිරීම.
7. ප්‍රජා මූල සංවිධාන වල කටයුතු ඵලදායී ලෙස සිදු කිරීම සඳහා සහභාගීත්ව පසු විපරම් ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම.
8. ප්‍රජා මූල සංවිධාන සහ ඔවුන් විසින් කළමනාකරණය කරනු ලබන ජල යෝජනා ක්‍රමවල දීර්ඝ කාලීන පැවැත්ම තහවුරු කරනු වස් උපාය මාර්ග හඳුනා ගැනීම හා ක්‍රියාත්මක කිරීමට ප්‍රජා මූල සංවිධාන පෙළඹවීම හා සහාය වීම. ඒ සඳහා සිදුකල යුතු ප්‍රතිසංස්කරණ හා වැඩිදියුණු කිරීම් සඳහා අවශ්‍ය මුල්‍ය හා තාක්ෂණික සහය ලබාදීම
9. ප්‍රජා මූල සංවිධාන විසින් සපයනු ලබන ජලය අවශ්‍ය සෑම විටකම පිරිපහදු කර ලබා දීමට ප්‍රජා මූල සංවිධාන යොමු කිරීම හා ඊට අවශ්‍ය තාක්ෂණික සහාය ලබා දීම.
10. ප්‍රජා මූල සංවිධාන,ප්‍රාදේශීයසංසද පිහිටුවීම ,දිස්ත්‍රික් සංසද පිහිටුවීම හා ජාතික සංසද පිහිටුවීම.
11. ප්‍රජා මූල සංවිධානවලට අයත් ජල යෝජනා ක්‍රම මඟින් සපයනු ලබන ජලයේ ගුණාත්මක භාවය අඛණ්ඩව නිරීක්ෂනය කිරීම සඳහා ප්‍රායෝගික ක්‍රමවේදයක් හඳුනා ගැනීම හා ක්‍රියාත්මක කිරීම.
12. ජල මූලාශ්‍ර සංරක්ෂණය , වැඩියුණු කිරීම සහ ජල ආරක්ෂණ සැලැස්ම සකස් කිරීම
13. ප්‍රජා ජල ව්‍යාපෘති වල පැවැත්ම තහවුරු කිරීම සඳහා ප්‍රජාමූල සංවිධානයේ කලමණාකරණ කටයුතු විධිමත් කිරීම සඳහා අවශ්‍ය පුහුණුවීම් ලබාදීම
14. වැසි ජල කළමණාකරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

1.4. සංවිධාන සටහන

මෙම දෙපාර්තමේන්තුවේ කාර්යභාරය ජනතාව අතරට ගෙනයාම සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයෙක් යටතේ පාලනය වන ප්‍රධාන කාර්යාලයකින් හා දිස්ත්‍රික්ක කාර්යාල 25 කින්ද ඊට අදාල කාර්යය මණ්ඩලයකින්ද සමන්විත වේ. දෙපාර්තමේන්තුව සඳහා 511ක සමස්ථ කාර්යමණ්ඩලයක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් අනුමත කර ඇති අතර 2022.12.31 දින වන විට 466 ක සමස්ථ කාර්යය මණ්ඩලයක් සේවය කරයි. (මාණ්ඩලික නිලධාරීන් 22ක් ඇතුළුව).සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක්ම ආවරණය වන පරිදි උපාධිධාරියෙකු අනුයුක්ත කර ඇති අතර කලාප ඉංජිනේරුවන් හා තාක්ෂණ නිලධාරීන් කලාප මට්ටමින් අනුයුක්ත කර ඇත.

එහි සංවිධාන ව්‍යූහය පහත පරිදි වේ.

සංවිධාන ව්‍යුහය- ප්‍රධාන කාර්යාලය



දිස්ත්‍රික් සංවිධාන ව්‍යුහය



1.5. **දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ**

2014 වර්ෂයේ ආරම්භ කළ මෙම දෙපාර්තමේන්තුව අධ්‍යක්ෂ ජනරාල් වරයෙක් යටතේ පාලනය වන අතර වර්තමානය වන විට ප්‍රධාන කාර්යාලයකින් හා දිස්ත්‍රික් කාර්යාල 25 කින් සමන්විත වේ. ප්‍රධාන කාර්යාලය පහත සඳහන් අංශ යටතේ ක්‍රියාත්මක වේ.

1. පාලන අංශය
2. සංවර්ධන හා සැළසුම් අංශය
3. ගිණුම් අංශය
4. තාක්ෂණ අංශය
5. ප්‍රසම්පාදන අංශය
6. මෙහෙයුම් හා ඇගයුම් අංශය
7. අභ්‍යන්තර විගණන අංශය

පාලන අංශය

ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති කාර්යභාරය හා වගකීම් ඉටුකරමින් මහජනතාවට කාර්යක්ෂම හා ඵලදායී සේවාවක් සැපයීම සඳහා මානව සම්පත් හැසිරවීම හා දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනයට සහය වීම පාලන අංශයට පැවරී ඇති කාර්යභාරය වේ. දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය සඳහා සේවාස්ථ හා මානව සම්පත් සංවර්ධනයට අදාල පුහුණු වැඩසටහන් සංවිධානය පාලන අංශය විසින් සිදුකරනු ලැබේ. මෙම සියළු කටයුතු කළමණාකරණය කිරීම ශ්‍රී ලංකා පරිපාලන සේවයේ 1 පන්තියේ අධ්‍යක්ෂවරයෙක් ඇතුළු කාර්යය මණ්ඩලය 21 දෙනෙකුගෙන් යුත් කාර්ය මණ්ඩලයක් සේවය කරයි

සංවර්ධන හා සැලසුම් අංශය

සංවර්ධන හා සැලසුම් අංශය දෙපාර්තමේන්තුවට අදාල සියලුම සංවර්ධන හා සැලසුම් කටයුතු මෙම අංශය මගින් සිදුකරයි. දිස්ත්‍රික් මට්ටමින් සංවර්ධන අවශ්‍යතා හඳුනා ගැනීම, ඒ අනුව වාර්ෂික ක්‍රියාත්මක සැලැස්ම සකස් කිරීම සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම, ප්‍රජාමූල සංවිධාන සඳහා පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම, ප්‍රජාමූල සංවිධාන ලියාපදිංචි කිරීම, ප්‍රගති වාර්තා හා කාර්ය සාධන වාර්තා සකස් කිරීම, ව්‍යාපෘති වාර්තා සකස් කිරීම, ඇතුළු සෘජුව සංවර්ධනයට අදාළ වෙනත් ක්‍රියාකාරකම් රාශියක් මෙම අංශය මඟින් ඉටු කරනු ලබයි. මෙම සියළු කටයුතු අධීක්ෂණය හා සුපරීක්ෂණය කිරීම සඳහා ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ 1 පන්තියේ අධ්‍යක්ෂවරයෙක් ඇතුළු කාර්යය මණ්ඩලය 12 දෙනෙකුගෙන් යුත් කාර්ය මණ්ඩලයක් සේවය කරයි

ගිණුම් අංශය

මෙම අංශය මගින් දෙපාර්තමේන්තුවට අදාළ සියලු ගෙවීම් කටයුතු සිදුකිරීම , මාසික, වාර්ෂික ගිණුම් වාර්තා පිළියෙල කිරීම හා භාණ්ඩාගාරයට ලබා දීම, අවසාන ගිණුම් සකස් කිරීම , අත්තිකාරම් පියවීම් කටයුතු, විගණන විමසුම් සඳහා පිළිතුරු ලබාදීම, ගිණුම් කාරකසභා කටයුතුවලදි ඒ සම්බන්ධ සම්බන්ධීකරණ කටයුතු කිරීම, වාර්ෂික ගිණුම් පියවීමේ කටයුතු මෙම අංශය මගින් සිදුකරන ප්‍රමුඛතම කාර්යය වේ. මෙම සියළු කටයුතු අධීක්ෂණය හා සුපරීක්ෂණය කිරීම සඳහා ශ්‍රී ලංකා ගණකාධිකරණ සේවයේ 1 පන්තියේ ප්‍රධාන ගණකාධිකාරීවරයෙක් ඇතුළු කාර්ය මණ්ඩලය 18 දෙනෙක් සේවය කරයි .

තාක්ෂණ අංශය

දෙපාර්තමේන්තුවට අදාළ සියළුම තාක්ෂණ කාර්යයන් මෙම අංශය මගින් ඉටු කරනු ලබයි. නව ජල ව්‍යාපෘති ඉදිකිරීම් කටයුතු සඳහා සැලසුම් සහ ඇස්තමේන්තු සකස් කිරීම, පවතින ව්‍යාපෘති වල පුනරුත්ථාපන කටයුතු හා නඩත්තු කටයුතු සඳහා අදාල සියලු ඇස්තමේන්තු සකස් කිරීම, ඉදිකිරීම් කටයුතු පරීක්ෂාකර අවශ්‍ය තාක්ෂණ උපදෙස් ලබාදීම, ඉදිකිරීම් අධීක්ෂණය, බිල්පත් සැකසීම, අනුමැතිය ලබාදීම, තාක්ෂණික ක්ෂේත්‍රයට අදාළ පුහුණුවීම් සංවිධානය, ප්‍රජා ජල ව්‍යාපෘති නඩත්තුව පිළිබඳ ප්‍රජා මූල නියෝජිතයන්ට අවශ්‍ය පුහුණුව ලබා දීමට සහය වීම, වාර්ෂික ක්‍රියාත්මක සැලැස්ම සකස් කිරීමට සහය වීම ආදිය මෙම අංශයෙන් කරන ප්‍රධානම කාර්යයන් වේ. මෙම සියළු කටයුතු අධීක්ෂණය හා සුපරීක්ෂණය කිරීම සඳහා ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ 1 පන්තියේ අධ්‍යක්ෂවරයෙක් , ඉංජිනේරුවරුන් ඇතුළු කාර්ය මණ්ඩලය 12 දෙනෙක් සේවය කරයි .මීට අමතරව කලාප මට්ටමින් ඉංජිනේරුවරු හා තාක්ෂණ නිලධාරීන් අනුයුක්තව ඇත.

ප්‍රසම්පාදන අංශය

දෙපාර්තමේන්තුවේ කටයුතු පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය මිලදී ගැනීම් කටයුතු මෙන්ම ප්‍රජා ජල ව්‍යාපෘති වල කටයුතු පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය සියළු මිලදී ගැනීම් කටයුතු ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සහ මූල්‍ය රෙගුලාසි වලට අනුව සිදුකිරීම මෙම අංශයේ කාර්යයභාරය වේ. මෙම සියළු කටයුතු අධීක්ෂණය හා සුපරීක්ෂණය කිරීම සඳහා ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ 1 පන්තියේ අධ්‍යක්ෂවරයෙක් , ඉංජිනේරුවරයෙකු ඇතුළු ඇතුළු කාර්ය මණ්ඩලය 08 දෙනෙක් සේවය කරයි .

මෙහෙයුම් හා ඇගයුම් අංශය

දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරනු ලබන සියළු සංවර්ධන වැඩසටහන් හා ව්‍යාපෘති මෙන්ම දැනට දිවයින පුරා ස්ථාපිත කර ඇති සියළු ප්‍රජා මූල සංවිධාන නිසි අධීක්ෂණයට හා සුපරීක්ෂණයට හා ඇගයීමට ලක් කිරීමේ කාර්යයභාර මෙම අංශය මගින් සිදුකරනු ලබයි. සැලසුම් කරනු ලබන ව්‍යාපෘති කාර්‍යක්ෂමව හා ඵලදායීව නිමා කොට ජනතාවට ප්‍රතිලාභ අත්පත් කර දීමට මෙම අංශය දැඩි මැදිහත්වීමකින් කටයුතු කරයි. විශේෂයෙන් ලෝක බැංකු ආධාර යටතේ මේ සම්බන්ධයෙන් නවීන තාක්ෂණයෙන් යුතු කළමනාකරණ තොරතුරු පද්ධතියක් සකස් කර ඇත. ඒ තුලින් ග්‍රාමීය ජල සම්පාදන ක්ෂේත්‍රයේ විධිමත් සංවර්ධනයට හා සැලසුම්කරණයට අදාල ඉතාමත් නිවැරදිවූත් යාවත්කාලීනවූත් දත්ත හා තොරතුරු මෙම අංශයෙන් ලබාගැනීමට හැකිවීම විශේෂ ජයග්‍රහණයකි. සියළු ප්‍රජා ජල ව්‍යාපෘති

ඇතුලත් පරිගණකගත තොරතුරු පද්ධතියක් සකස් කිරීම, දෙපාර්තමේන්තුවට වෙබ් අඩවියක් සකස් කිරීම, ජනතාවට ක්ෂණික දුරකථන ඇමතුම් ලබා දීමේ පහසුකම් සැලසීම මගින් ගැටළු සඳහා විසඳුම් ලබාදීම ඉක්මන් කිරීම,ප්‍රජා මූල සංවිධාන කටයුතු පිළිබඳ සමීප අධීක්ෂණයක් සිදුකිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීම හරහා ජනතාවට ඉතා කඩිනම් හා කාර්යක්ෂම සේවාවක් සැපයීම මෙන්ම සංවර්ධන ව්‍යාපෘති ඉතාමත් ඵලදායීව හා කාර්යක්ෂමව මෙහෙයවීම මෙම අංශය තුලින් සිදුකරනු ලබයි.

මෙහෙයුම් හා ඇගයුම් ක්‍රමවේදය වඩාත් ඵලදායීව හා කාර්යක්ෂව ක්‍රියාත්මක කිරීමටත් ඒ අනුව ප්‍රගති සමාලෝචන රැස්වීම් හා අනෙකුත් රැස්වීම් සඳහා නිළධාරීන් කොළඹට ගෙන්වා සිදුකරනු ලබන අනවශ්‍ය වියදම් හා කාල කළමණාකරණය කිරීම මෙමගින් අපේක්ෂිතය, මෙම සියළු කටයුතු අධීක්ෂණය හා සුපරීක්ෂණය කිරීම සඳහා ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ 1 පන්තියේ අධ්‍යක්ෂවරයෙක් ඇතුළු කාර්යය මණ්ඩලය 8 දෙනෙකුගෙන් යුත් කාර්ය මණ්ඩලයක් සේවය කරයි

අභ්‍යන්තර විගණන අංශය

මෙම අංශය වෙනම ඒකකයක් ලෙස 2020 වර්ෂයේදී ස්ථාපිත කරන ලදී. ආයතනය මගින් සිදුකරන කාර්යයන් වඩාත් නිවැරදිව සිදුකිරීමත්, අභ්‍යන්තර පාලන ක්‍රියාවලිය විනිවිදභාවයකින් නිවැරදි ක්‍රමවේදයකට සිදුකිරීමට යොමුකිරීම තුල සිදුවන වැරදි අඩුපාඩු අවම කිරීමත් මෙම අංශය පිහිටුවීමේ මූලික අරමුණ වේ. එමෙන්ම ප්‍රජා ජල ව්‍යාපෘති වල සිදුවන වැරදි අඩුපාඩු අවම කර නිවැරදි ක්‍රියාවලියක් තුල සංවිධාන ගමන් කරවීමත් ,වංචා දූෂණ සිදුවීමට ඇති අවස්ථා අවම කරවීමට ක්‍රියාමාර්ග ගැනීමත් මේ තුලින් අපේක්ෂිත තවත් අරමුණක් වේ. මෙම සියළු කටයුතු අධීක්ෂණය හා සුපරීක්ෂණය කිරීම සඳහා ශ්‍රී ලංකා ගණකාධිකරණ සේවයේ II පන්තියේ අභ්‍යන්තර විගණකවරයෙක් ඇතුළු නිලධාරීන් තිදෙනෙකු සඳහා තනතුරු අනුමත කොට ඇත. 2020 වර්ෂයේ මෙම විගණන අංශය විධිමත්ව ස්ථාපිත කරනු ලැබුවත් පුරප්පාඩු වූ II පන්තියේ ගණකාධිකාරී වරයෙකු පත්කර ගැනීමේ අපහසුතාවය මත මෙහි කටයුතු අකර්මණ්‍යව පවතී . රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයට මේ පිළිබඳව දැනුම් දී ඇති අතර ඉතා කඩිනමින් මෙම ගැටළුවට විසඳුම් ලබාදීමට අපේක්ෂා කෙරේ.

දිස්ත්‍රික් කාර්යාල

ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවේ කාර්යභාරය ජනතාවට වඩාත් සමීප කරවීම සඳහා සියලුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි දිස්ත්‍රික් කාර්යාල පිහිටුවා ඇත. දිස්ත්‍රික්කයේ පවතින ප්‍රජා ජල අවශ්‍යතා හඳුනා ගැනීම, ප්‍රමුඛතා ගත කිරීම, ප්‍රජාමූල සංවිධාන ගොඩනැගීම, පවතින ප්‍රජාමූල සංවිධාන ශක්තිමත් කිරීම හා නියාමනය කිරීම, හඳුනාගත් ජල අවශ්‍යතා පාදක කරගනිමින් ව්‍යාපෘති සැලසුම් හා වාර්තා සකස් කර පාර්ශව වෙත යොමුකර අවශ්‍ය අරමුදල් සම්පාදනය කර ගැනීම, ප්‍රජා මූල සංවිධාන වල ගැටළු හඳුනාගැනීම, විසඳුම් ලබාදීම හා ධාරිතා සංවර්ධනය, අවශ්‍ය තාක්ෂණික සහය ලබාදීම හා ජලයේ ගුණාත්ම ක තත්වය පවත්වාගෙන යාම සඳහා ප්‍රජා මූල සංවිධාන යොමුකර වීම, ජල පෝෂක ප්‍රදේශ ආරක්ෂා කිරීමට ජනතාව පෙළඹවීම හා තොරතුරු රැස් කිරීම යාවත්කාලීන කිරීම ආදිය දිස්ත්‍රික් කාර්යාල මගින් ඉටුකරනු ලබන ප්‍රධාන කාර්යය වේ.

එම කාර්යභාරය ඉටුකිරීම සඳහා සෑම දිස්ත්‍රික්කයකම දිස්ත්‍රික් ස්ථාන භාර නිලධාරියෙකු යටතේ සමස්ථ දිස්ත්‍රික්කයම ආවරණය කල හැකි වන පරිදි දිස්ත්‍රික්කයේ විශාලත්වය, ප්‍රජා මූල සංවිධාන සංඛ්‍යාව,

පවත්නා නල ජල ආවරණය වැනි සාධක පාදක කර ගනිමින් සංවර්ධන නිලධාරීන් ඇතුළු කාර්ය මණ්ඩලයක් අනුයුක්තව සේවය කරනු ලබයි. මීට අමතරව තාක්ෂණික මග පෙන්වීම් ලබාදීම සඳහා පළාත් මට්ටමින් දිස්ත්‍රික් ඉංජිනේරුවරු හා තාක්ෂණ නිලධාරීන් අනුයුක්ත කර ඇත.

1.6. අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව/ පළාත් සභාව යටතේ පවතින ආයතන/ අරමුදල්

දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයතන හෝ අරමුදල් නොපවතින අතර දෙපාර්තමේන්තුවේ කාර්යභාරය ජනතාවට වඩාත් සමීප කරවීම සඳහා සියලුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි දිස්ත්‍රික් කාර්යාල පිහිටුවා ඇත, දෙපාර්තමේන්තුවේ සියළු පාලන හා මූල්‍ය කටයුතු මධ්‍යගතව සිදුකරන අතර ප්‍රජා ජල ව්‍යාපෘති වල කටයුතු දිස්ත්‍රික් කාර්යාල හරහා සිදුකරනු ලබයි.

1.7. විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු (තිබේ නම්) -

දෙපාර්තමේන්තුව යටතේ සෘජුව ක්‍රියාත්මක වන ව්‍යාපෘති නොමැති අතර ජල සම්පාදන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක WASSIP ව්‍යාපෘතිය මහවැලි හා පරිසර අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක CRIWMP ව්‍යාපෘති වල පාර්ශවකරුවෙකු ලෙස දෙපාර්තමේන්තුව කටයුතු කරයි.

02 පරිච්ඡේදය

ප්‍රගතිය හා ඉදිරි දැක්ම

විශේෂ ජයග්‍රහණ , අභියෝග හා ඉදිරි ඉලක්ක

2.1 2022 වර්ෂයේ ක්‍රියාත්මක කල සංවර්ධන වැඩසටහන් හා ව්‍යාපෘති

ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවට 2022 වාර්ෂික අයවැයෙන් වෙන් කරනු ලැබූ සමස්ථ ප්‍රතිපාදන ප්‍රමාණය රුපියල් මිලියන 603.69 ක් වුවත් පලාත් සභා සහ විවිධ ආයතන වල ඉල්ලීම් පාදක කරගනිමින් රු.මි. 1,186.57 තරම් ප්‍රතිපාදන ප්‍රමාණයක් ලබා ගැනීමට හැකි වීම දෙපාර්තමේන්තුව ලද ජයග්‍රහණයකි. දෙපාර්තමේන්තුවේ ප්‍රතිපාදන පාදක කරගනිමින් ක්‍රියාත්මක කිරීමට අනුමත කරන ලද 364 ක් වූ ව්‍යාපෘති ප්‍රමාණය 940 ක් දක්වා ඉහල නංවා ගැනීමට දෙපාර්තමේන්තුවට බාහිර ආයතන වලින් ලද ප්‍රතිපාදන ඉවහල් වූ බවද මෙහිලා සඳහන් කල යුතුයි. ආරම්භ කරන ලද ව්‍යාපෘති අතුරින් 324 ක වැඩ නිම කිරීමට හැකිවූ අතර ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපාති සංඛ්‍යාව 616 කි. විශාල අභියෝග රැසක් මැද ක්‍රියාත්මක වූ 2022 වර්ෂයේ සමස්ථ සංවර්ධන වැඩ සඳහා වෙන් කල මුළු ප්‍රතිපාදනයෙන් 76.33% තරම් වූ ඉහල මූල්‍ය ප්‍රගතියක් වාර්තා කිරීමට හැකිවීමද සුවිශේෂ ජයග්‍රහණයකි.

2.1.1 සමස්ථ ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගතිය

අනුමත කළ ව්‍යාපෘති සංඛ්‍යාව	940
සම්පූර්ණ කළ ව්‍යාපෘති සංඛ්‍යාව	324
දැනට ක්‍රියාත්මක ව්‍යාපෘති සංඛ්‍යාව	616
ලැබුණු මුළු ප්‍රතිපාදන (බාහිර ආයතන වලින් ලද ප්‍රතිපාදන ඇතුළුව)	රු.මි. 1186.57
මුළු වියදම	රු.මි. 813.20
අතැති බිල්පත්	රු.මි. 92.54

2.1.2 දෙපාර්තමේන්තු ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කල ව්‍යාපෘති වල ප්‍රගතිය

	වැඩසටහන	ක්‍රියාත්මක ව්‍යාපෘති	ලැබුණු මුළු ප්‍රතිපාදන (රු.මි.)	අනුමත කළ ව්‍යාපෘති සංඛ්‍යාව	මූල්‍ය ප්‍රගතිය		භෞතික ප්‍රගතිය	
					වියදම (රු.මි.)	අතැති බිල්පත් (රු.මි.)	ක්‍රියාත්මක ව්‍යාපෘති	නිමි ව්‍යාපෘති
1	ප්‍රජා ජල ව්‍යාපෘති වැඩි දියුණු කිරීම	පවතින ව්‍යාපෘති පුනරුත්තාපනය හා වැඩිදියුණු කිරීම හා සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම	100	80	72.36	2.01	70	10
2	ප්‍රජා ජල අභිමාණී වැඩසටහන	දිස්ත්‍රික්ක 25 සඳහා ආරම්භ කරන ලද නව ව්‍යාපෘති 214ක වැඩ අවසන් කිරීම.	453.98	214	399.42	40.69	201	50
		ප්‍රජා ජල ව්‍යාපෘති 30ක් සඳහා නැනෝ පිරිපහදු පද්ධති ස්ථාපනය කිරීම.	38.49	30				
		ප්‍රජා ජල ව්‍යාපෘති 7ක පුනරුත්තාපන වැඩ අවසන් කිරීම.	7.53	7				
3	ජල ආරක්ෂණ සැලැස්ම	ප්‍රජා ජල ව්‍යාපෘති සඳහා ජල ආරක්ෂණ සැලසුම් සහ භූගත ජලය පුනරාරෝපණය සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.	3.69	33	1.37	0.71	11	22
			603.69	**364**	**473.15**	**43.41**	**282**	**82**

2.2 විශේෂ ජයග්‍රහණ

2022 වර්ෂයේ රටක් ලෙස දැඩි ආර්ථික අර්බුදයකට ලක්වීම මත සියළු ක්ෂේත්‍රවල කඩාවැටීමක් සිදුවුවද ග්‍රාමීය ජල සම්පාදන ක්ෂේත්‍රය තුල දෙපාර්තමේන්තුවක් ලෙස විශේෂ ජයග්‍රහණ අත්කර ගැනිමට හැකිවිය.

1. ගම් දහසකට සුරක්ෂිත පානීය ජලය ලබාදීමේ අරමුණින් මධ්‍යකාලීන වැඩසටහනක් ලෙස නව ජල ව්‍යාපෘති ස්ථාපිත කිරීම සඳහා ආරම්භ කල "ප්‍රජා ජල අභිමානී" වැඩසටහන අඛණ්ඩව ඉදිරියට ගෙනයාම. මේ හරහා 2022 වර්ෂයේ නව ජල සම්බන්ධතා 9429 ක් ලබාදීම.
2. වකුගඩු රෝගය බහුලව පවතින දිස්ත්‍රික් වල නැනෝ පිරිපහදු පද්ධති 90ක ආරම්භ කිරීම සහ ඉන් 50ක් ජනතා අයිතියට පත් කිරීම

3. දැනට ක්‍රියාත්මක ප්‍රජා ජල ව්‍යාපෘති 152 ක් සඳහා ජල පොම්ප ලබාදීම හා ජල ව්‍යාපෘති 135 ක අත්‍යවශ්‍ය පුනරුත්ථාපන කටයුතු සිදුකිරීම
4. ජල ආරක්ෂණ සැලැස්ම ක්‍රියාත්මක කරන ජල ව්‍යාපෘති 33 ක අත්‍යවශ්‍ය පුනරුත්ථාපන කටයුතු සිදුකිරීම.
5. දෙපාර්තමේන්තුවේ කාර්යයන් ඉටුකරගෙන යාමේදී අත්‍යවශ්‍ය භෞතික හා මානව සම්පත සම්පූර්ණ කර ගැනීම. 16 ක් වූ අනුමත ඉංජිනේරු කාර්යය මණ්ඩලය සම්පූර්ණ කර ගැනීම.
6. WASSIP ව්‍යාපෘතිය යටතේ දත්ත පද්ධතිය යාවත් කාලීන කිරීම සහ වෙබ් මූලික කරගත් තොරතුරු කළමනාකරනය පිළිබඳ සංවර්ධන නිලධාරීන් පුහුණු කිරීම
7. WASSIP ව්‍යාපෘතිය යටතේ සියළුම ආකාරයේ ජල පිරිපහදු තාක්ෂණය පිළිබඳව ඉංජිනේරුවරුන් සහ තාක්ෂණ නිලධාරීන් පුහුණු කිරීම
8. UNDP ප්‍රතිපාදන යටතේ තාක්ෂණික ධාරිතා සංවර්ධනය සහ ව්‍යාපෘති සැලසුම්කරණය පිළිබඳ කාර්ය මණ්ඩල පුහුණු කිරීම හා ප්‍රජා මූල සංවිධාන අතර දැනුම බෙදා ගැනීම සහ සම්බන්ධීකරණය පිළිබඳ දැනුවත් කිරීම් සිදු කිරීම
9. උතුරු පළාතේ දිස්ත්‍රික්ක 3 ක නැවත පදිංචි කරන ලද ජනතාව සඳහා නැනෝ පිරිපහදු යන්ත්‍ර 50ක් ස්ථාපනය කිරීම
10. 2022 ලෝක ජල දිනය වෙනුවෙන් හොදම ප්‍රජා මූල සංවිධානය තෝරා ඇගයීම් කිරීම හා ප්‍රජා මුල සංවිධාන සාමාජිකයින් සඳහා රක්ෂණ ක්‍රමයක් හදුන්වා දීම.
11. වර්ල්ඩ් විෂන් ආයතනය සමග ඒකාබද්ධව ප්‍රජා ජල ව්‍යාපෘති සම්බන්ධව ජල සමුළුවක් පැවැත්වීම

2.3 . ඉදිරි ඉලක්ක

තිරසර සංවර්ධන අරමුණු යටතේ වර්ෂ 2030 වනවිට සැමට සුරක්ෂිත පානීය ජලය ලබාදීම සඳහා එහි සාමාජික රටක් ලෙස ශ්‍රී ලංකාවද බැඳී සිටින බැවින් ඉදිරි කාලය දෙපාර්තමේන්තුවට ඉතා අභියෝගාත්මක කාලයක් ලෙස හැදින්විය හැකිය. පවතින අර්බුද කාලය තුල පවතින සම්පත් කළමකරණය කරගනිමින් ග්‍රාමීය ප්‍රජාවට සුරක්ෂිත පානීය ජලය ලබාදීම සඳහා දෙපාර්තමේන්තුවේ ඉදිරි ඉලක්ක සකස් කර ඇත.

- දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි සියළු ප්‍රජා ජල ව්‍යාපෘති රජයට බරක් නොවී පවත්වාගෙන යා හැකි ආකාරයට එම සංවිධාන බලගැන්වීම
- පසුගිය දශක හතරක කාල සීමා තුල ස්ථාපිත කර ඇති ප්‍රජා ජල ව්‍යාපෘති වලින් ලබාදෙන ජලයේ ගුණාත්මක බව ඉහළ නැංවීම සඳහා අවශ්‍ය කරන පිරිපහදු ක්‍රම ස්ථාපිත කිරීම.
- ජාතික ජල සම්පාදන මණ්ඩලයට ජලය සැපයිය නොහැකි දුෂ්කර ගම්මාන දහසකට සුරක්ෂිත පානීය ජලය ලබාදීමේ අරමුණින් මධ්‍යකාලීන වැඩසටහනක් ලෙස ආරම්භ කල ප්‍රජා ජල අභිමාණී වැඩසටහන අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම
- සෑම ප්‍රජා ජල ව්‍යාපෘතියකටම ජල ආරක්ෂණ සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කිරීම

- ග්‍රාමීය ජල සම්පාදන කෂේත්‍රයට ස්ථාපිත කල ජාතික දත්ත පද්ධතිය යාවත්කාලීන කර පවත්වාගෙන යාම
- ග්‍රාමීය හා වතු ප්‍රජාව පාදක කර ගනිමින් සනීපාරක්ෂක වැසිකිලි පහසුකම් වලින් 100% ඉලක්කය කරා ලගාවීම
- වකුගඩු රෝගය බහුලව පවතින ප්‍රදේශ වල ජනතාවට සුරක්ෂිත පානීය ජලය ලබාදීම සදහා පිරිපහදු පද්ධති ස්ථාපිත කිරීම (RO Plant/Nano Plant/EDR Plant)

2.3 . අභියෝග

2022 වර්ෂය මෙරට ආර්ථිකය අන් කවරදාවකටවත් වඩා මුහුණ නොදුන් ආකාරයේ අභියෝගාත්මක ගැටළු රැසකට මුහුණ දුන් වර්ෂයක් ලෙස මෙහිලා සදහන් කල යුතුය. රට තුල ඇති වූ ආර්ථික අස්ථායිතාවය නිසා මෙම ක්ෂේත්‍රයේද දැවැන්ත පසුගාමී තත්ත්වයක් පෙන්නුම් කරන ලදි.

1. ප්‍රතිපාදන ප්‍රමාණවත්ව අනුමත නොවීම හා වර්ෂයට අනුමත කල ප්‍රතිපාදන වලින් 50% කපා හැරීම.
2. සෑම ගිවිසුම්ගත කොන්ත්‍රාත්තුවක් සඳහාම කොන්ත්‍රාත්කරුවන් මිල විචලතාවයන් ඉල්ලීම තුල ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම.
3. ඉදිකිරීම් ක්ෂේත්‍ර තුල පවතින භාණ්ඩ හිගය
4. අක්මුදල් නිසිපරිදි නොලැබීම නිසා ගිවිසුම්ගත කාලයේදී ව්‍යාපෘති නිම කිරීමට නොහැකිවීම
5. ප්‍රජා මූල සංවිධාන නියාමනයට පවතින නීතිමය රාමුව අනුමත වීමේ කාල ප්‍රමාදය
6. ප්‍රජා ජල ව්‍යාපාති සංකල්පය තුල ව්‍යාපාති වල අඛණ්ඩ පැවැත්මට අත්‍යවශය සාධකයක් වන ප්‍රජා දායකත්වය ලබාගැනීමේදි ගැටළු මතුවීම
7. ජලමූලාශ්‍ර සිදීයාම, ප්‍රමාණවත් නොවීම හා පවතින ජල මූලාශ්‍ර අපවිත්‍ර වීම හේතුවෙන් මතුවී ඇති අර්බුද.දේශගුණික විපර්යාසයන් මෙන්ම මිනිසාගේ විවිධවූ ක්‍රියාකාරකම් හේතුවෙන් ජල මූලාශ්‍ර අපවිත්‍ර වීමටත්, දූෂණයට ලක්වීමටත් සිදුවීඇත. නාගරීකරණය හා රටතුල සිදුවන වේගවත් සංවර්ධන ක්‍රියාදාමයන් හමුවේද මෙය දැඩි අර්බුදකාරී තත්ත්වයකට පත්ව ඇත.
   දේශගුණික විපර්යාසයන් මෙන්ම සැලසුම් කරන ලද ව්‍යාපෘති වල ඉලක්ක ගත කණ්ඩායම සැලැස්ම අභිබවා යමින් ප්‍රතිලාභ ලබාදීමට ක්‍රියාකිරීම තුල ජල උල්පත් ප්‍රමාණවත් නොවීම ද ප්‍රභල අභියෝගයකි.
8. ව්‍යාපාති ක්‍රියාත්මක කිරීමේදි බාහිර පාර්ශව මගින් ඉටුකරගතයුතු කාර්යයන් (ඉඩම් අවසර, විදුලිය , මාර්ග අවසර ලබාගැනිම) ප්‍රමාද විම හේතුවෙන් ව්‍යාපාති ආරම්භ කිරීමට මෙන්ම වැඩ අවසන් කලද ජනතාවට ප්‍රතිලාභ ලබාදීමේ ප්‍රමාදයන් සිදුවීම.

9. දැනට ක්‍රියාත්මක ව්‍යාපෘති මගින් පිරිපහදු නොකර බෙදාහරින ජලය නැවත පිරිපහදු කිරීමට ඇති ගැටළුව.
   දශක හතරකට අධික කාලයක් තුල බහුතර ව්‍යාපෘති ප්‍රමාණයක පිරිපහදු කිරීමකින් තොරව ජලය ලබාදෙන අතර ව්‍යාපෘති සැලසුම තුල පිරිපහදු පද්ධතියක් ඇතුලත් නොවීම හේතුවෙන් නැවත අළුතෙන් පිරිපහදු පද්ධති සැලසුම් කිරීමේදී අමතර පිරිවැයක් දැරීමට සිදුවීම.

10. වැඩසටහන් සැලසුම් කලද ඒවා ක්‍රියාත්මක කිරීම සදහා සම්පත් යොදවා ගැනිම
    රටතුල මතුවූ ඉන්ධන අර්බුදය මත ප්‍රවාහන වියදම් ඉහලයාම නිසා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ පසුබෑමක් ඇතිවීම

.....

ගණන්දීමේ නිලධාරි

.....

ප්‍රධාන ගණන්දීමේ නිලධාරි

03 පරිච්ඡේදය

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසිඒ-එෆ්

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

අයවැය 2022			සටහන	තත්‍ය		
				2022	2021	
				රු.	රු.	
-		**ආදායම් ලැබීම්**		-	-	
-		ආදායම් බදු	**1**	-	-	ඒසිඒ-1
-		දේශීය භාණ්ඩ හා සේවා මත බදු	**2**	-	-	
-		ජාත්‍යන්තර වෙළඳාම මත බදු	**3**	-	-	
-		බදු නොවන ආදායම් හා වෙනත්	**4**	-	-	
-		**මුළු ආදායම් ලැබීම් (අ)**		-		
-		**ආදායම් නොවන ලැබීම්**		-		
768,721,050		භාණ්ඩාගාර අග්‍රිම		1,166,922,552	1,495,466,500	ඒසිඒ-3
1,000,000,000		තැන්පතු		71,000,227	112,042,156	ඒසිඒ-4
11,000,000		අත්තිකාරම් ගිණුම්		8,683,372	6,058,879	ඒසිඒ-5
		වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		39,423,220	12,301,273	
1,779,721,050		**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**1,286,029,371**	1,625,868,809	
1,779,721,050		**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**1,286,029,371**	1,625,868,809	
		භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)		-		
1,779,721,050		**ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)**		1,286,029,371	1,625,868,809	

		අඩු කළා : වියදම්				
-		**පුනරාවර්තන වියදම්**		-		
249,000,000		වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	**5**	239,207,900	197,391,587	
82,170,000		අනෙකුත් භාණ්ඩ හා සේවා	**6**	71,907,256	43,510,299	**ඒසිඒ-2(ii)**
700,000		සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	**7**	614,735	557,536	
-		පොළී ගෙවීම්	**8**	-		
60,000		වෙනත් පුනරාවර්තන වියදම්	**9**	-		
331,930,000		**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**311,729,891**	241,459,422	
		මූලධන වියදම්				
4,950,000		මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	**10**	1,793,978	3,158,584	
400,000		මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	**11**	300,000	1,680,230	
-		ප්‍රාග්ධන මාරුකිරීම්	**12**	-		**ඒසිඒ-2(ii)**
-		මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	**13**	-		
200,000		හැකියා වර්ධනය	**14**	199,000	66,642	
603,696,000		වෙනත් මූලධන වියදම්	**15**	473,150,838	970,554,478	
609,246,000		**මුළු මූලධන වියදම් (උ)**		**475,443,816**	975,459,934	
		තැන්පතු ගෙවීම්		80,428,491	52,995,801	**ඒසිඒ-4**
		අත්තිකාරම් ගෙවීම්		13,203,432	9,552,235	**ඒසිඒ-5**
		වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-		
		ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		93,631,923	62,548,036	
941,176,000		**මුළු වියදම් එ = (ඊ+උ+ඌ)**		880,805,630	1,279,467,392	
-		**දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)**		405,223,741	346,401,417	
		අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		405,223,741	346,401,417	**ඒසිඒ-7**
		දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය				**ඒසිඒ-3**

2022 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

		සටහන	තත්‍ය		2021
		-	රු.		රු.
මූල්‍ය නොවන වත්කම්		-			-
		-			-
දේපළ, පිරියත හා උපකරණ		ඒසිඒ-6	122,200,655		73,560,677
මූල්‍ය වත්කම්					
අත්තිකාරම් ගිණුම්		ඒසිඒ-5/5(ඒ)	23,420,047		18,899,987
මුදල් හා මුදල් සමාන දෑ		ඒසිඒ-3	-		-
මුළු වත්කම්			**145,620,702**		**92,460,664**
ශුද්ධ වත්කම් / ස්කන්ධය					
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්			(205,575,027)		(219,523,351)
දේපළ පිරියත හා උපකරණ සංචිතය			122,200,655		73,560,677
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය		**ඒසිඒ-5(බී)**			
ජංගම වගකීම්					
තැන්පතු ගිණුම්		ඒසිඒ-4	228,995,074		238,423,338
අග්‍රිම ශේෂය		ඒසිඒ-3	-		-
මුළු වගකීම්			**145,620,702**		**92,460,664**

පිටු අංක 1.සිට 65 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 66 සිට 75 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළදිරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් ව්‍යාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

…….....	…….....	……..
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
නම :	නම :	අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
තනතුර :	තනතුර :	නම :
දිනය :	දිනය :	දිනය :

3.5 මූල්‍ය ප්‍රකාශ සටහන්

වාර්තාකිරීමේ පදනම

1) වාර්තාකරණ කාලපරිච්ඡේදය

2022 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2) මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3) ආදායම් හඳුනාගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

4) දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

5) දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

6) මුදල් හා මුදල් සමාන දෑ

2022 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

* යම් වාර්තාකරණ ආයතනයකට විශේෂිත වූ ගනුදෙනු ඇති අවස්ථාවල දී රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අනුමැතිය සහිතව එම තොරතුරු මූල්‍ය ප්‍රකාශවල අදාළ පරිදි ඇතුළත් කර ගත හැක. එසේම ‘‘වාර්තාකරණ පදනම’’ යටතේ එම විශේෂිත ගනුදෙනු සඳහා අවශ්‍ය හෙළිදරව් කිරීම ඇතුළත් කළ හැක.

* තම වාර්තාකරණ ආයතනයට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති පමණක් වාර්තාකිරීමේ පදනම යටතේ හෙළිදරව් කළ යුතු ය.

3.6 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය - අදාල නැත

රු. ,000

ආදයම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස

3.7වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු. ,000

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදනප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	273,385.00	331,930.00	311,729.89	93.91
ප්‍රාග්ධන	1,207,250.00	609,246.00	475,443.82	**78.04

** සත්‍ය වියදම අඩු අගයක් ගෙන ඇත්තේ අතැති බිල්පත් වටිනාකම වූ රු.මි 42.44 සඳහා අක්මුදල් නොලැබීම හේතුවෙන් ගෙවීම් කල නොහැකි වූ නිසාවෙනි . එම මුදලද වර්ෂය තුල ගෙවිය හැකි වූයේ නම් සත්‍ය වියදම රු.මි.517.884 වන අතර අවසාන ප්‍රතිපාදනයේ ප්‍රතිශත අගයද 85 % දක්වා ඉහළ යනු ඇත.

3.8 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල %ලෙස
			මුල්ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
1	ජල සම්පාදන අමාත්‍යාංශය	නවජල ව්‍යාපෘති ඉදිකිරීම, පවතින ජලව්‍යාපෘති පුනරුත්ථාපනය ,වකුගඩු රෝග නිවාරණය, ,වැසි ජල ටැංකි ඉදි කිරීම, සනීපාරක්ෂක පහසුකම්	371,577,14	371,577,14	339,217,54	91.29
2	නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය	උතුරු නැගෙනහිර පළාත් වල නැවත පදිංචි කිරීමේ කටයුතු වේගවත් කිරීම (නැනෝ පිරිපහදු පද්ධති ලබාදීම)	27,950.00	27,950.00	27,950.00	100
3	රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය-	උපාධිධාරි අභ්‍යාසලාභී දීමනාගෙවීම	42,211.87	42,211.87	38,997,38	92.38

3.9 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය- අදාල නැත

රු. ,000

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2022 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	31.12.2022 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේ දී ගිණුම්කරණය ට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්				
9152	යන්ත්‍රෝපකරණ				
9153	ඉඩම්				
9154	අස්පෘෂ්‍ය වත්කම්				
9155	ජීව විද්‍යාත්මක වත්කම්				
9160	කෙරීගෙන යන වැඩ				
9180	බදු දෙන ලද වත්කම්				

3.10විගණකාධිපතිවරයාගේ වාර්තාව**

අමුණා ඇත (ඇමුණුම් අංක 1)

04 පරිච්ඡේදය

කාර්ය සාධන දර්ශක

10.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100%- 90%	75%-89%	50%- 74%
නව ජල ව්‍යාපෘති 214 ක් ඉදිකිරීම.		75%	
පවතින ජල ව්‍යාපෘති 87 ක පුනරුත්තාපනය කිරීම.	90%		
වකුගඩු රෝග නිවාරණය සඳහා නැනෝ පිරිපහදු පද්ධති 30ක් ස්ථාපනය කිරීම.		85%	
අඩු ආදායම්ලාභීන් 928ක් සඳහා සනීපාරක්ෂක වැසිකිළි ඉදිකිරීම.		85%	
ප්‍රජා ජල ව්‍යාපෘති සඳහා ජල ආරක්ෂණ සැලසුම් සහ භූගත ජලය පුනරාරෝපණය සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.		85%	

05 පරිච්ඡේදය

තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න.

ඉලක්කය / අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0%-49%	50%-74%	75%-100%
සැමට සුරක්ෂිත ජලය හා සනීපාරක්ෂාව	2030 වන විට ආරක්ෂිතව කළමනාකරණය කළ ජල සැපයුම	ජනගහන ආවරණ %			91.3%
	2030 වන විට සැමට ආරක්ෂිතව කළමනාකරණය කල නළ ජල සැපයුම සඳහා ප්‍රවේශය	ජනගහන ආවරණ %		59.76%	

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න.

(1) ලෝක බැංකුව, UNDP, යුනිසෙෆ්, යුරෝපා වැනි ජාත්‍යන්තර සංවිධාන හා ආයතන වල මූල්‍ය අනුග්‍රාහකත්වය හා තාක්ෂණ දායකත්වය අඛන්ඩව ලැබීම.

(2) දෙපාර්තමේන්තුවේ කාර්යභාරය හා විෂය පථය පුලුල්වීම මත ජලයෙන් දැඩි පීඩාවට පත් දුෂ්කර හා අති දුෂ්කර ගම්මාන වලට විකල්ප ජලමූලාශ්‍ර ඔස්සේ සුරක්ෂිත පානීය ජලය සැපයීමට හැකියාව ලැබීම.

(3) නැවත තරුණ උපාධිධාරීන් විශාල ප්‍රමාණයක් දෙපාර්තමේන්තුවයට අනුයුක්ත කිරීම තුල කාලයක් තිස්සේ මෙම සංවර්ධන ප්‍රවාහය ගම දක්වා රැගෙන යාමට පැවති බාධාව ඉවත් වීම හා අනුමත ඉංජිනේරු කාර්යය මණ්ඩලය සම්පූර්ණ කර ගැනීමට හැකිවීම වැනි කරුණු තිරසර සංවර්ධන ඉලක්ක අත්පත් කර ගැනීම සඳහා 2022 වර්ෂය තුල ලද විශේෂ ජයග්‍රහණ ක් ලෙස හඳුන්වා දිය හැක.

ශ්‍රී ලංකාවේ ඇති වූ ආර්ථික අර්බුදය හා අස්ථායීතාවයද මෙම ක්ෂේත්‍රයේදී අප ලද දැවැන්ත අභියෝගයක් ලෙස හැඳින්විය හැකිය. ඒ තුල ප්‍රතිපාදන සීමා වීම හා අනුමත කල ප්‍රතිපාදන 50% කපා හැරීම , ඉදිකිරීම් ද්‍රව්‍ය හිගවීම හා අධික ලෙස මිල ඉහළ යාම . ඉන්ධන අර්බුදය , අක්මුදල් ප්‍රමාණාත්මකව නොලැබීම ප්‍රධාන බාධාවන් වේ.

06 පරිච්ඡේදය

මානව සම්පත් පැතිකඩ

06.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු / (අතිරික්ත)
ජේෂ්ඨ	36	22	14
තෘතීයික	05	00	05
ද්විතියික	400	407	(07)
ප්‍රාථමික	70	37	33

*2022.12.31 දින වන විට **මාණ්ඩලික නිලධාරීන් 01** දේශීය වැටුප් රහිත නිවාඩු අයදුම් කර ඇති අතර **සංවර්ධන නිලධාරීන් 02 සහ කළමනාකරණ සේවා නිලධාරීන් 02** විදේශීය වැටුප් රහිත නිවාඩු අයදුම් කර ඇත.

06.2 **ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න.

ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය දැඩි බලපෑමක් එල්ල කරනු ලබයි. 2022.12.31 දින වන විට මෙම දෙපාර්තමේන්තුවේ අනුමත කාර්යය මණ්ඩලය 511 වන අතර විවධ ශ්‍රේණි යටතේ අනුමත වී ඇති තනතුරු නාම 18 සඳහා පුරප්පාඩු 117 පවතී. විශේෂයෙන්, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් අනුමත වී ඇති “තාක්ෂණ නිලධාරී” තනතුරු 40 පුරප්පාඩු වී පැවතීම හේතුවෙන් ඒ සඳහා කොන්ත්‍රාත් පදනම මත නිලධාරීන් 21 අනුයුක්ත කර දිස්ත්‍රික් කාර්යාල 25 රාජකාරී කටයුතු කළමනාකරණය කර ගන්නා අතර, ඒකාබද්ධ රියදුරු සේවයේ තනතුරු 36 අනුමත වී ඇති නමුත් 2022.12.31 දිනට සේවයේ යෙදී සිටින්නේ රියදුරන් 13 පමනි.

මෙම මානව සම්පත් හිඟය දෙපාර්තමේන්තුවේ එදිනදා කටයුතු කාර්යක්ෂමව හා ඵලදායීව පවත්වාගෙන යාමට විශාල බාධාවක් වී ඇත. ජ්‍යෙෂ්ඨ මට්ටමේ සිට ප්‍රාථමික මට්ටම දක්වා පවත්නා මානව සම්පත් හිඟය උපරිම අයුරින් කළමනාකරණය කර ගනිමින් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය උපරිම මට්ටමින් පවත්වාගෙන යාමට කටයුතු කිරීමේ අභියෝගයට සියළුම නිලධාරීන් සිය දායකත්වය සපයනු ලබයි.

දෙපාර්තමේන්තුවේ විෂය පථය හා කාර්යභාරය තුල සංවර්ධන ව්‍යාපෘති රාශියක් සමස්ථ දිවයිනම ආවරණය කරමින් සිදුකරන මොහොතක නිළධාරීන්ගේ හිඟය විශේෂයෙන්ම ව්‍යාපෘති ඇස්තමේන්තු කිරීම , අධීක්ෂණය හා සුපරීක්ෂනයට දැඩි බලපෑමක් එල්ල කර ඇත.

07 පරිච්ඡේදය

අනුකූලතා වාර්තාව

7.1 අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය කිරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ.		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ.		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අදාල නොවේ.		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අදාල නොවේ.		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අදාල නොවේ.		
1.6	වෙනත්	අදාල නොවේ.		
2	**පොත්පත් භාලේඛනනඩත්තුකිරීම(මූ.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනයයාවත්කාලීනකර පවත්වාගෙන යාම	අදාල නොවේ.		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ.		

2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.8	තොග ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20)යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම	අනුකූල වේ.		
3.2	මූල්‍ය බලතල පවරාදීමපිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ.		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතලපවරාදී තිබීම	අනුකූල වේ.		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ.		
4	**වාර්ෂික සැලසුම්සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.	-	-
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අදාල නොවේ.		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ.		

4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල නොවේ.		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අදාල නොවේ.	.	
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අදාල නොවේ.		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අදාල නොවේ.		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අදාල නොවේ.		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMAචක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අදාල නොවේ.		
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකරතිබීම	අනුකූල වේ.		

8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛඅංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ.		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල වේ.		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ.		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අනුකූල නොවේ.	ආයතනවලින් වාර්තා හා අනුමැතිය ලබා ගැනීමට කාලයක් ගතවීම	අදාල වෙනත් ආයතන වෙතින් වාර්තාවන් නිසි පරිදි ලබා ගැනීම.
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ.		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ.		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම.	අනුකූල වේ.		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අදාල නොවේ.		

10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ.		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ.		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නෙඉක්මවන පරිදි බැරකම්වලට එලඹීම	අනුකූල වේ.		
12	**රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්ට වලට අනුකූල වීම.	අනුකූල වේ.		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ.		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අදාල නොවේ.		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම.	අනුකූල නොවේ.		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ.		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල නොවේ.		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ.		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ.		

15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූල වේ.		
15.2	රැස් කර තිබූ ආදයම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ.		
15.3	මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ.		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම	අනුකූල වේ.		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනිබීම	අනුකූල වේ.		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ.		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ.		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක	අනුකූල වේ.		

	කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම			
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ.		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ.		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල වේ.		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කොට තිබීම	අනුකූල වේ.		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ.		

අවසානය.

තිරසාර සංවර්ධන අරමුණු වලට අනුව යමින් 2030 වර්ෂයේදී සැමට සුරක්ෂිත පානීය ජලය සැපයීම සඳහා ශ්‍රී ලංකාවද එකඟ වී ඇත. එම දැවැන්ත අභියෝගය කරා යාම සඳහා පානීය ජල සම්පාදන ක්ෂේත්‍රය සඳහා රජයේ ප්‍රමුඛස්ථානයක් හිමි වී ඇත. රටක් ලෙස 2022 වර්ෂයේ මුහුණ දුන් දැවැන්ත අභියෝග හමුවේ වුවද මේ සඳහා ලබාදුන් ප්‍රමුඛස්ථානය වෙනස් වී නැත.

එවැනි තත්ත්වයක් තුල ග්‍රාමීය ජල සම්පාදන ක්ෂේත්‍රය හරහා මෙම ඉලක්කය කරා ලඟා වීමට දෙපාර්තමේන්තුවක් ලෙස පවතින සම්පත් කළමණාකරනය කර ගනිමින් දැඩි කැපවීමෙන් කටයුතු කරන ලදී. ඒ සඳහා විශේෂයෙන් දායක වූ දේශපාලන අධිකාරීය, සියළුම නිලධාරීන් හා ප්‍රජාව මේ අවස්ථාවේ දී සිහිපත් කරමි.

මෙම ඉලක්කය කරා ලඟාවීමේදී ජල සම්පාදන අමාත්‍යාංශය යටතේ ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව වෙත පවරා ඇති විෂය පථය හා වගකීම තුල 2022 වර්ෂයේ ඉටුකරන ලද කාර්ය සාධනය පිලිබඳ තොරතුරු වර්ෂ අවසානයේ පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමේ ව්‍යවස්ථාපිත අවශ්‍යතාවය සපුරාලනු වස් මෙම සංක්ෂිප්ත වාර්තාව සකසන ලදී.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } ඩබ්ඒඑස්/ඩී/ඩීඑන්ඕඩබ්ලිව්එස්/එෆ්ඒ/2022

මගේ අංකය / எமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2023 මැයි 18 දින

අධ්‍යක්ෂ ජනරාල්
ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව

ශීර්ෂය 332 - ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 332 - ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී ඉදිරිපත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34
+94 11 2 88 72 23
ag@auditorgeneral.gov.lk
www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව	ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය	මෙම වාර්තාවේ ඡේද යොමුව
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව 2021 වර්ෂයේ විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාවේ 1.6.1.2.1 (අ) ඡේදය	භාණ්ඩාගාර අවසන් ගිණුම් ප්‍රකාශනයන් (එස්ඒ 82 ආකෘතිය) අනුව රු.37,967,000 ක් වටිනා ප්‍රවාහන උපකරණ දෙපාර්තමේන්තුව සතුව පවතින බව දක්වා තිබුණද, රු.12,900,000 ක් වටිනා වෙනත් ආයතනවලට අයත් මෝටර් වාහන 05 ක්ද ඒ තුළ ඇතුලත් බව දෙපාර්තමේන්තු පොත් හා ස්ථාවර වත්කම් ලේඛණය පරීක්ෂාවේදී විගණනයට නිරීක්ෂණය වීම සහ ඒ අනුව දෙපාර්තමේන්තු මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුලත් ස්ථාවර වත්කම් වටිනාකමේ නිරවද්‍යතාව පිළිබඳ විගණනයට සෑහීමකට පත්විය නොහැකි බැවින් දෙපාර්තමේන්තුවට අයත් ස්ථාවර වත්කම් නිවැරදිව හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන හා ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කළ යුතු බව.	1.6.3 (අ)

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ආදායම් නොවන ලැබීම්

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 2 හි 26 වන ඡේදයට අනුව මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ඇති වන මුදල් ප්‍රවාහයන් වෙනම හෙළිදරව් කළ යුතු වුවත් වර්ෂය තුල එක්සත් ජාතීන්ගේ ජාත්‍යන්තර ළමා හදිසි අරමුදල (UNICEF) මගින් ලද මුළු විදේශ ප්‍රදාන වටිනාකම රු.1,375,552 ක් මූල්‍ය ප්‍රකාශන පරිශීලනය කරන පාර්ශවයන්ට සෘජුව අනාවරණය වන පරිදි මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිතවූ මුදල් ප්‍රවාහයන් යටතේ වන ප්‍රදානයන් ලෙස දක්වා නොතිබුණු අතර

මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිතවූ මුදල් ලෙස සටහන්කර තිබුණි. ඒ අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිතවූ මුදල් ප්‍රවාහය රු.1,375,552 ක් වැඩියෙන්ද මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිතවූ මුදල් ප්‍රවාහයන් එම වටිනාකමින් අඩුවෙන්ද සටහන් වී තිබුණි.

1.6.2 පුනරාවර්තන හා මූලධන වියදම්

අතිරේක ප්‍රතිපාදන සහ මුදල් රෙගුලාසි 66 යටතේ ප්‍රතිපාදන මාරුකිරීම් සංශෝධිත අයවැය ඇස්තමේන්තු තුල ඇතුලත්ව තිබූ බැවින් වෙනම නොදැක්විය යුතු බව 2022 සැප්තැම්බර් 21 දිනැති අයවැය චක්‍රලේඛ අංක 06/2022 හි 5 වන ඡේදය මඟින් උපදෙස් දී තිබුණත් මූල්‍ය ප්‍රකාශනවල වැඩසටහන් අනුව වියදම් සාරාංශයෙහි (ඒ.සී.ඒ-2 හා ඒ.සී.ඒ-2(ඒ)) පුනරාවර්තන වියදම් ලෙස රු.15,000,000 ක් සහ ප්‍රාග්ධන වියදම් ලෙස රු.2,696,000 ක් වශයෙන් එකතුව රු.17,696,000 ක පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදන පෙන්වා තිබුණි. ඒ අනුව එම ආකෘති පත්‍රයන්හි 1 වැනි තීරුවෙහි දක්වා තිබූ පුනරාවර්තන වියදම් සහ ප්‍රාග්ධන වියදම්වල අයවැයගත ප්‍රතිපාදන වටිනාකම් සංශෝධිත අයවැය ඇස්තමේන්තුවෙහි ඇතුලත් අගයන්ට අනුරූපීව ඉදිරිපත්කර නොතිබුණි.

1.6.3 මූල්‍ය නොවන වත්කම්

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) මූල්‍ය ප්‍රකාශනවල SA 82 මූල්‍ය නොවන වත්කම් පිළිබඳ වාර්තාවෙහි ඇතුළත් කර තිබූ රු.74,767,000 ක් වටිනා ප්‍රවාහන උපකරණ තුල රු.10,700,000 ක් වටිනා වෙනත් ආයතනවලට අයත් මොටර් වාහන 04 ක්ද ඇතුලත් බව දෙපාර්තමේන්තු පොත් හා ස්ථාවර වත්කම් ලේඛනය පරීක්ෂා කිරීමේදී අනාවරණය විය.

(ආ) නගර සැළසුම් සහ ජල සම්පාදන අමාත්‍යාංශයේ ලේකම් නමින් ලියාපදිංචි කර තිබූ එකක් රු.218,500 ක් බැගින් එකතුව රු.13,984,000 ක් වටිනා යතුරුපැදි 64 ක් ජල සම්පාදන හා සනීපාරක්ෂාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (WASSIP) මඟින් දෙපාර්තමේන්තුව වෙත ලැබී තම සේවකයන්ගේ පරිහරණය සඳහා බෙදාහැර තිබූ අතර විගණන දිනය වූ 2023 මාර්තු 30 වන විටත් එම යතුරුපැදිවල අයිතිය දෙපාර්තමේන්තුව වෙත පවරා ගෙන, එවායේ තක්සේරු වටිනාකම් දෙපාර්තමේන්තුවේ ගිණුම් පොත්වලට සහ වාහන ලේඛනයට ඇතුලත් කිරීමට කටයුතුකර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 24 වන ඡේදය අනුව වත්කම් එහි පිරිවැයට මැනිය යුතු අතර එහි ප්‍රත්‍යාගණන අගයට හඳුනාගනු ලබන්නේ නම් පිළිගත් හා අදාළ වෘත්තීය සුදුසුකම් සහිත තක්සේරුකරුවකු මඟින් තක්සේරු කරනු ලැබිය යුතුය. කෙසේ වුවද, දෙපාර්තමේන්තුව විසින් කල්බදු පහසුකම යටතේ මිලදී ගන්නා ලද මෝටර්

රථ 07 ක වටිනාකම රු.36,800,000 ක් ලෙස යාන්ත්‍රික ඉන්ජිනේරුවරයකු දැන්වූ බවට අධ්‍යක්ෂ පාලන විසින් ලබාදුන් ලිඛිත තහවුරුවක් මත මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

1.6.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

දෙපාර්තමේන්තුව විසින් පරිහරණය කරමින් පවතින රු.800,000 ක් වටිනා GC-0258 අංක දරන වාහනය දෙපාර්තමේන්තුවට අයත් වාහනයක් බව තහවුරු කිරීමට අදාල ලිඛිත සාක්ෂි ලිපිගොනු තුල නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 අග්‍රිම කළමනාකරණය

දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික අයවැය මඟින් ලබාදුන් ප්‍රතිපාදන වලට අදාල වර්ෂය තුලදී එකතුව රු.4,812,840,440 ක අග්‍රිම ඉල්ලුම්කර තිබුණද ඉන් රු.1,166,922,552 ක් පමණක් ලැබී තිබුණි. සැළසුම් කළ පරිදි අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීමට මෙම තත්ත්වය බාධාවක් වී තිබුණි.

2.2 වියදම් කළමනාකරණය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 50 ට අනුව සකසුරුවම්කම සහ කාර්යක්ෂමතාව පිළිබඳ අවදානය යොමු නොකර ඇස්තමේන්තු සකස් කිරීම හේතුවෙන් වැය විෂයන් 15 ක් සඳහා වෙන්කර තිබූ ප්‍රතිපාදනවලින් සියයට 10 සිට සියයට 100 දක්වා පරාසයක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. ඉන් වැය විෂයන් 02 ක් සඳහා වෙන්කළ සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ආ) එක්සත් ජාතීන්ගේ අන්තර්ජාතික හදිසි ළමා අරමුදල (UNICEF) මඟින් රටෙහි යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ලැබී තිබූ විදේශ ප්‍රදාන යටතේ වූ සියයට 62 ක් එනම් රු.2,320,448 ක් ඉතිරිව පැවතුනි. මෙම වැය විෂය යටතේ ඉහත ප්‍රතිපාදන වෙන්කිරීම්වලින් අයවැයගත ප්‍රතිපාදනයට අමතරව වර්ෂය තුලදී සංශෝධිත අයවැය ඇස්තමේන්තු මඟින්ද රු.2,696,000 ක අතිරේක ප්‍රතිපාදන වෙන්කර තිබුණද එම ප්‍රතිපාදන වලින්ද රු.375,552 ක් පමණක් එනම් සියයට 13.9 ක් වියදම් කර තිබුණි.

2.3 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(අ) දෙපාර්තමේන්තුව මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය. එමෙන්ම එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණි. එහෙත් එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, වාර්තාවේ 3.4 ඡේදය ප්‍රකාරව විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී නොතිබුණි.

(ඇ) අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායී ක්‍රමවේදයක් ඇති බවට ගණන්දීමේ නිලධාරී සහතිකවිය යුතු වුවත්, වාර්තාවේ 4.2 ඡේදයේ සඳහන් නිරීක්ෂණ අනුව එම අවශ්‍යතාවය ඉටු කර නොතිබුණි.

2.4 **නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

නීති, රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(අ) **ශ්‍රී ලංකා ප්‍රජාත්‍රාන්තික සමාජවාදී ජනරජයේ මූදල් රෙගුලාසි**	
i. 751(1), 752, 763	සමාලෝචිත වර්ෂය තුල ප්‍රජා ජලසම්පාදන ව්‍යාපෘතිවල ඉදිකිරීම් කටයුතු සඳහා දෙපාර්තමේන්තුව විසින් මිලදීගෙන ප්‍රජාමූල සංවිධාන වෙත බෙදාහැර තිබූ එකතුව රු.192,705,000 ක් වටිනා ජල පොම්ප හා උපාංග සහ පරිත්‍යාග ලෙස ලැබී තිබූ වටිනාකම

රු.27,464,400 ක් ලෙස සටහන්වී තිබූ ජල මීටර් 2,543 භාරදීම් හා භාරගැනීම් පිළිබඳ තොරතුරු බඩුලේඛණ පොත්වල හෝ වෙනත් සටහන් පොත්වල ඇතුලත් කර යාවත්කාලීන වූ තොරතුරු පවත්වාගෙන යාමට කටයුතු කර නොතිබුණි.

ii. 565(5) ජේදය

පොදු 71 ආකෘති පත්‍රයෙහි පිළියෙල කල මාසික තැන්පතු සාරාංශ ප්‍රකාශයක් ඊළඟ මාසය අවසන් වීමට පෙර විගණකාධිපති දෙපාර්තමේන්තුව වෙත යැවිය යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ආ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 2006**

i. 4.2.3 ජේදය

දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති වෙනුවෙන් කරනු ලබන මිලදී ගැනීම් ආර්ථිකව සහ ඵලදායීව සිදුකිරීම සඳහා අදාළ උපාංග හා උපකරණවල සත්‍ය අවශ්‍යතාවය හඳුනාගෙන සමාලෝචිත වර්ෂයට අදාළව ප්‍රසම්පාදන සැලැස්මක්, ප්‍රසම්පාදන කාල සටහනක් සකස්කර ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ලබාගත යුතු වුවත් එසේ සිදුකර නොතිබුණි.

ii. 4.1හා 4.4 ජේද

පාරවල්, ජලාපවහන, ඇලවල් ආදියේ වැඩ කොන්ත්‍රාත් දේශීය ලංසු කරුවන් විසින් ඉටු කළ හැකි වන පරිදි තනි ගොනුවලට බෙදා එකම වේලාවක මෙම ගොනු බොහොමයක් සඳහා ලංසු කැඳවිය හැකි වුවත් එවැනි ඵලදායී ක්‍රමයකට අවතීර්ණ නොවී මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු.68,097,893 ක් වූ මැණික්කඩවර හා පල්ලේගම ගම්මානවල පවුල් 800 ක් සඳහා පිරිසිදු පානීය ජලය ලබා දීමේ ව්‍යාපෘතිය අදියර 10 කට බෙදා අවස්ථා කිහිපයකදී ප්‍රජා මූල සංවිධාන 02 කට හා පුද්ගලික ආයතන 03 කට ලබා දීමට දෙපාර්තමේන්තුව කටයුතු කර තිබුණි.

iii. 5.4.8 ඡේදය	කාර්යසාධන සුරක්ෂණය වැඩ නිම කිරීමට හෝ භාණ්ඩ සැපයුම නිම කිරීමට නියමිත දිනයෙන් ඔබ්බට දින 28 ක් දක්වා වලංගු විය යුතු වුවද සමාලෝචිත වර්ෂයේ එකතුව රු.7,917,250 ක් වැය කරමින් ජල පොම්ප 06 ක් මිලදී ගැනීමේදී ලබාගෙන තිබූ කාර්යසාධන සුරක්ෂණය වැඩ නිම කළ යුතු දිනට පමණක් ලබාගෙන තිබුණි.
iv. 8.9.1 ඡේදය	කොන්ත්‍රාත් ප්‍රදානයකට අදාලව විධිමත් ප්‍රතිග්‍රහන ලිපි නිකුත් කිරීමත් සමගම ඊට අදාල ගිවිසුම් අත්සන් කළ යුතු වුවත්, තඹාන, මොරොන්තුමුල්ල හා කොන්ගොල්ල ප්‍රජා ජල ව්‍යාපෘතීන්ට අදාල දෙවන අදියර යටතේ වටිනාකම රු.29,042,921 ක්වූ කොන්ත්‍රාත්ඩ03 ක් පෞද්ගලික කොන්ත්‍රාත් ආයතනයක් වෙත ප්‍රදානය කර තිබූ අතර ප්‍රතිග්‍රහන ලිපි නිකුත් කිරීමෙන් අනතුරුව කොන්ත්‍රාත් ගිවිසුම් අත්සන් කිරීම සඳහා මාස 02 සිට මාස 2 ½ ක ප්‍රමාදයන් සිදුව තිබුණි.

2.5 අවධිමත් ගනුදෙනු

2012 ජනවාරි 05 දිනැති අංක 01/2012 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.1 ඡේදය හා 2021 සැප්තැම්බර් 29 දිනැති අංක 01/2021 දරණ චක්‍රලේඛයේ 2.1 ඡේදය ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා සහ ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නම් කරනු ලබන නියෝජිතයින් දෙදෙනෙකුගෙන් සමන්විත ත්‍රිපුද්ගල කමිටුවක් මඟින් ප්‍රජා පාදක සංවිධාන වෙත ඉදිකිරීම් කොන්ත්‍රාත්තු පැවරිය හැකි වුවද, මැණික්කඩවර හා පල්ලේගම ගම්මානවල පවුල් 800 ක් සඳහා පිරිසිදු පානීය ජලය ලබා දීමේ ව්‍යාපෘතිය පැවරීමේදී එවැනි ත්‍රිපුද්ගල කමිටුවක නිර්දේශ මත සිදුකර නොතිබුණි. කෙසේ වුවද, දෙපාර්තමේන්තුව විසින් ප්‍රජාමූල සංවිධාන හා පුද්ගලික කොන්ත්‍රාත්කරුවන් මඟින් එම කටයුත්ත ආරම්භ කර තිබුණද, අපේක්ෂිත අරමුණට ලභාවිය නොහැකිව ව්‍යාපෘතිය අසාර්ථක වී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

3.1.1 දැක්ම හා මෙහෙවර

2014 වර්ෂයේ ජල සම්පාදන අමාත්‍යාවරයා විසින් ඉදිරිපත් කරන සංදේශයකට අනුව ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවක් ස්ථාපිත කිරීම සඳහා වූ පනත් කෙටුම්පත සඳහා 2014 ජූලි මස 11 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණි. එහෙත් විගණන දිනය වූ 2023 මාර්තු 31 වන විට දෙපාර්තමේන්තුව ආරම්භ කර වර්ෂ 8 ක කාලයක් ඉක්ම ගොස් තිබුණද අදාල පනත සම්මත කර ගැනීමට කටයුතු කර නොතිබුණි. එසේ වුවද විධිමත් නෛතික පසුබිමක් නොමැතිව ප්‍රජා මූල සංවිධාන 4530 කට ආසන්න සංඛ්‍යාවක් දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි කර ලියාපදිංචි සහතික නිකුත්කිරීම සහ එම සංවිධාන මගින් පානීය ජලය ලබා ගන්නා ග්‍රාමීය ජනතාවගෙන් මාසිකව ගාස්තු අයකිරීම වැනි කටයුතු නියාමනය කිරීම දෙපාර්තමේන්තුව විසින් සිදුකරමින් පැවතුණි.

3.1.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

විගණන නියැදි පරීක්ෂාවලදී අනාවරණය වූ කරුණු පහත සඳහන් වේ.

(අ) ජල සම්පාදන රාජ්‍ය අමාත්‍යාංශ හා ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තු ප්‍රතිපාදන යටතේ එක් ආයතනයකින් 40 බැගින් Nano Filters 80 ක් පෞද්ගලික ආයතනයක් මගින් ඉදිකර ස්ථාපිත කිරීමට 2021 වර්ෂයේ කොන්ත්‍රාත් පිරිනමා තිබුණි. ඉන් 50 ක් 2021 ජුනි වන විටද ඉතිරිය 2022 ජනවාරි වන විටද ඉදිකර අවසන් විය යුතුව තිබුණද, විගණන දිනය වූ 2022 නොවැම්බර් 24 වන විටත් එම කොන්ත්‍රාත්තුව අවසන් කර නොතිබූ අතර ඉදි කිරීම් කටයුතුද අතරමග නතර කර තිබුණි.

කොන්ත්‍රාත්කරු විසින් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.14.1 ප්‍රකාරව කොන්ත්‍රාත් කාලය දීර්ඝ කර ගැනීමට ඉල්ලීම් ඉදිරිපත් කර නොතිබුණු බැවින් ප්‍රමාද ගාස්තු අය කිරීම සහ කාර්යසාධන ඇපකර මුදල් කර ගැනීමේ හැකියාව තිබුණද එසේ කර නොතිබුණි.

මෙම ව්‍යාපෘතියේ ප්‍රමානපත්‍රවල සඳහන් ප්‍රමිතීන්ට පටහැනිව කළගල් වෙනුවට බ්ලොක් ගල් භාවිතා කිරීම, අහල් 5 ක් ඝණකම slab වෙනුවට අහල් 2ක් ඝණකම ඇති slab ඉදිකිරීම සහ අඩු ගුණත්වයෙන් යුතු අමුද්‍රව්‍ය භාවිතා කර තිබීම, ඇලුමිනියම් Box Bar වෙනුවට යකඩ Bar සවිකිරීම , වහලය mac Foil layer සවි කිරීමෙන් තොරව ආවරණ නිවස්නයේ ඇස්බැස්ටෝස් තහඩු යොදා සවිකරතිබීම, Suspended Malaysian Celling

සවිකර නොතිබීම, ඉදිකල පැතිබැමි නිසි ප්‍රමිතියකින් තොරව ඉදිකිරීම ආදී අඩුපාඩු නිබියදී තාක්ෂණික නිලධාරීන් ලබා දුන් ව්‍යාජ සහතික මත ඉහත ගෙවීම් කර තිබුණි.

(ආ) මොණරාගල දිස්ත්‍රික්කයේ ග්‍රාම නිලධාරී වසම් 4 ක නල ළිං 4 ක් ඉදිකිරීම සඳහා එකතුව රු.183,600 ක් වැයකරමින් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මගින් භූ විද්‍යාත්මක පරීක්ෂණ සිදුකර තිබුණි. විගණන දිනය වූ 2023 මාර්තු වන විටත් ඊට අදාල ඉදිකිරීම් අවසන් කර නොතිබුණු අතර එකතුව රු.1,260,058 ක් වැයකර ඉන් ළිං 2 ක් පමණක් ඉදිකර තිබුණි. එහෙත් ඉදිකල නල ළිං මගින් ජලය බෙදාහැරීමේ කටයුත්ත දෙපාර්තමේන්තුව මගින් සිදුකර නොතිබුණි. ඒ අනුව ඒ සඳහා වැයකල එකතුව වූ රු.1,443,658 ක සම්පූර්ණ මුදල නිෂ්කාර්ය වැයක් බවට පත්වෙමින් තිබුණි.

(ඇ) මොණරාගල දිස්ත්‍රික්කය තුල ක්‍රියාත්මක කරනලද ජල සම්පාදන ව්‍යාපෘති 04 ක් පිළිබඳ සිදුකරන ලද නියැදි පරීක්ෂණයකදී අනාවරණය වූ පරිදි එම ව්‍යාපෘතිවලට අදාළ ඉදි කිරීම් කොන්ත්‍රාත්තුවල ඇතුළත් කාර්යයන් 84 ක කිසිදු ඉදිකිරීමක් ඉටු කර නොතිබියදී එකතුව රු.2,195,071 ක් සහ අඩක් නිමකළ හෝ ප්‍රමානපත්‍රවල සඳහන් ප්‍රමිතීන්ට පටහැනිව ඉදිකිරීම් සිදුකළ ඉදිකිරීම් කාර්යයන් 17 ක් වෙනුවෙන් එකතුව රු.777,347 ක් දිස්ත්‍රික් ඉංජිනේරුවරුන්ගේ සහතිකය මත දෙපාර්තමේන්තුව විසින් ගෙවා තිබුණි. තවත් එක් ව්‍යාපෘතියක් සඳහා රු.3,929,236 ක් අත්තිකාරම් ලෙස ගෙවා ඊට අදාළව කිසිදු කටයුත්තක් සිදුකර නොතිබුණු අතර 2023 මාර්තු වනවිට එම ඉහත ව්‍යාපෘති සියල්ලම අතරමග අත්හැර දමා ඇති බව විගණන පරීක්ෂණවලදී අනාවරණය වී තිබුණි. ඒ අනුව ඒ සඳහා දෙපාර්තමේන්තුව වැය කර තිබූ එකතුව රු.17,730,116 ක මුදල නිශ්කාර්ය වැයක් බවට පත්වෙමින් තිබුණි.

(ඈ) මඩකලපුව දිස්ත්‍රික්කයේ ප්‍රදේශ 5 ක කැණීම් ළිං 4 ක් හා 50 m ක් උසැති ජල ටැංකියක් ඉදිකිරීම සඳහා පුද්ගලික ආයතනයකට කොන්ත්‍රාත් ලබා දී තිබුණි. එම කොන්ත්‍රාත්වල ඇස්තමේන්තුව හා ප්‍රමාණ පත්‍ර වල ඇතුලත් පරිදි ඡායාරූප ඇතුලත් ප්‍රගති වාර්තා ඉදිරිපත් කිරීම, රක්ෂණාවරණ ඉදිරිපත් කිරීම, ඉදිකිරීම් ද්‍රව්‍ය, වැඩ හා කොන්ක්‍රීට් නියමිත ප්‍රමිතියට ඇති බව තහවුරු කර ගැනීමට පරීක්ෂණ පැවැත්වීම හා පුද්ගලික දේපළවලට සිදු වන හානි සම්බන්ධයෙන් ගෙවීම් කිරීම සඳහා ප්‍රතිපාදන සලසා තිබූ අතර එම කාර්යයන් ඉටු කිරීම පිළිබඳ සාක්ෂී හෝ තහවුරු නොමැතිව රු.295,000 ක් දෙපාර්තමේන්තුව විසින් ගෙවා තිබුණි. එමෙන්ම එම ව්‍යාපෘතිවලට අදාල ප්‍රමාණ පත්‍රවල සඳහන් පරිදි ඉටු නොකළ වැඩ සඳහා සහ කළ වැඩ ප්‍රමාණය ඉක්මවා වැඩිපුර ගෙවීම් කිරීම වෙනුවෙන් රු.4,148,606 ක් රජයේ මුදල් නිෂ්කාර්ය ලෙස වැය කර තිබුණි. මෙම ව්‍යාපෘති ආරම්භ කිරීමට පෙර අදාල ස්ථානවල ජල තත්වත්ය පරීක්ෂාව ඇතුළත්ව ශක්‍යතා අධ්‍යනයක් සිදු කර නොතිබූ අතර ඉදිකර අවසන් කර තිබූ ළිං 03 ක ජලයෙහි තත්ත්වය අපේක්ෂිත මට්ටමට වඩා අඩු මෙන්ම

පරිහරණයට නුසුදුසු බව සිදුකරන ලද ජල නියැදි පරීක්ෂාවකදී තහවුරු වී තිබුණි. ඒ අනුව මෙම ජල සම්පාදන ව්‍යාපෘති 05 සැලසුම් කල අවධියේ සිට අවසාන ගෙවීම් කරන අවස්ථාව දක්වා ඊට අදාල නිළධාරීන් ඉතාමත් නොසැලකිල්ලෙන් රජයට පාඩු සිදුවන පරිදි කටයුතු කර තිබුණි.

3.1.3 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් සිදුකරනු ලැබේ.

(අ) මැණික්කඩවර හා පල්ලේගම ගම්මානවල පවුල් 800 ක් සඳහා පිරිසිදු පානීය ජලය ලබා දීමේ ව්‍යාපෘතියේ කාර්යයන් 14 ක් ඉටු කිරීම වෙනුවෙන් එකතුව රු.28,530,317 ක් පෞද්ගලික කොන්ත්‍රාත්කරුවකු වෙත ගෙවා තිබූ අතර ඊට අයත් Pump house හා Sand filter ඉදිකිරීම 2023 පෙබරවාරි වන විටත් සිදුකර නොතිබුණි. 2019 ඔක්තෝම්බර් 24 දින ආරම්භ කර තිබූ මෙම ව්‍යාපෘතියේ පළමු අදියර ආරම්භ කර විගණිත දින වන විට වසර 03 කට වඩා වැඩි කාලයක් ගත වුවද, ඉහත ඉදිකිරීම් නිමකර ව්‍යාපෘතිය අවසන් කර නොතිබූ බැවින් වැය කර තිබූ එකතුව රු.28,530,317 ක මුදල නිෂ්කාර්ය වැයක් බවට පත් වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවේ ප්‍රජා ජල අභිමානී ව්‍යාපෘතිය සඳහා වෙන් කර තිබූ රු.මි.500 ක ප්‍රතිපාදනවලින් සමස්ථ උපයෝජනය රු.මි.399.42 ක් වී තිබුණි. විගණනය වෙත ඉදිරිපත් කර තිබූ වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව ප්‍රගතිය පරීක්ෂා කිරීමේදී ව්‍යාපෘති 32 ක් ආරම්භ කර වසර 1 ත් 3 ත් අතර කාලයක් ගත වුවද භෞතික ප්‍රගතිය සියයට 10 ත් 50 ත් අතර මට්ටමක පැවතුන අතර සමාලෝචිත වර්ෂයේ අවසන් කිරීමට සැලසුම් කර තිබූ ව්‍යාපෘති 02 ක් වර්ෂය අවසන් වන විටත් ආරම්භ කර නොතිබුණි.

3.1.4 ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් සිදුකරනු ලැබේ.

(අ) දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලද තඹාන, මොරොන්තුමුල්ල හා කොන්ගොල්ල ප්‍රජා ජල ව්‍යාපෘතිය යටතේ 2021 වර්ෂයේ ප්‍රදානය කර තිබූ කොන්ත්‍රාත් 02 කට අදාළව එකතුව රු.3,929,236 ක් අත්තිකාරම් මුදල් ලෙස ලබා දී තිබුණු අතර විගණන දිනය වූ 2022 නොවැම්බර් 25 වන විටත් දින 90 ක කොන්ත්‍රාත් කාලයද ඉක්මවා මාස 10 ක් ගතව තිබූ නමුත් ඊට අදාළ කිසිදු ඉදි කිරීම් කටයුත්තක් සිදු වී නොතිබුණි. අදාල කොන්ත්‍රාත් කාර්යයන් සඳහා අවස්ථා කිහිපයකදී දින දීර්ඝ කිරීම් ලබා දී තිබුණි.

(ආ) අනුරාධපුර දිස්ත්‍රික්කයේ ප්‍රදේශ 05 ක ක්‍රියාත්මක වූ ප්‍රජා ජල අභිමානී වැඩසටහන යටතේ ඇස්තමේන්තුගත පිරිවැය රු.53,537,675 ක් වූ ජල ව්‍යාපෘති 4 ක කැණීම් ළිං, ජල ටැංකි හා පොම්පාගාර 3 ක් ඉදිකිරීමත් එක් ව්‍යාපෘතියක GI බට හා PVC බට එලීම සහ ජල පොම්පාගාරය ඉදිකිරීමටත් අදාල කොන්ත්‍රාත් 2021 වර්ෂයේ දෙසැම්බර් මස පුද්ගලික ආයතනයකට ප්‍රදානය කර තිබුණි. වර්ෂයක පමණ කාලයකදී අවසන් කල යුතු මෙම ව්‍යාපෘතිවලට අදාල ඉදිකිරීම්වලින් එක් ව්‍යාපෘතියක පමණක් පොම්පාගාරය ඉදිකිරීම අවසන් කර තිබුණද ඉතිරි වැඩ කොටස් වසරකට අධික කාලයක සිට නිම නොකර අත්හැර දමා ඇති බව 2023 පෙබරවාරි 21 දින සිදු කරන ලද විගණන පරීක්ෂණවලදී අනාවරණය වී තිබුණි.

3.1.5 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16.2 උප වගන්තිය ප්‍රකාරව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමග වාර්ෂික කාර්යසාධන වාර්තාවේ කෙටුම්පතක්ද විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

3.2 ප්‍රසම්පාදනයන්

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් සිදුකරනු ලැබේ.

(අ) දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂය තුල එකතුව රු.4,290,300 ක් වැය කර වසරක වගකීම් කාලයක් සහිතව ජලමනු 945 ක් මිලදීගෙන තිබුණු අතර එම මිලදී ගැනීම සිදුකර විගණන දිනය වූ 2023 මාර්තු වන විට වසරකට වඩා වැඩි කාලයක් භාවිතයකින් තොරව නිෂ්කාර්යව පවතී. ඒ අනුව වගකීමක් සහිත මිලට එම උපකරණ මිලදී ගැනීම පල රහිත වී තිබුණි.

(ආ) 2022 වර්ෂය තුලදී දිස්ත්‍රික් 11 ක ප්‍රජා මූල සංවිධාන 151 ක් සඳහා ජල පොම්ප මිලදී ගැනීමට ලංසු කැඳවා රු.192,705,000 කට ජල පොම්ප 161 ක් ආයතන 2 කින් මිලදී ගැනීමට කටයුතු කර තිබුණි. මීට අදාල ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී අංක 6.1.3, 6.1.4, 6.2.2, 6.3.6, 2.12(අ), 7.10.1(ආ), 7.12.4 හා 5.4.10(ආ) දරන ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට පටහැනිව පිළිවෙලින් ලංසු ලේඛණ නිකුත් කිරීම පිළිබඳ වාර්තා තබා නොගැනීම, ලංසු කැඳවීම සඳහා ප්‍රමාණවත් කාලයක් ලබා නොදීම, ලංසු විවෘත කිරීමේ කමිටු වාර්තා නිසි පරිදි නඩත්තු නොකිරීම, ප්‍රසම්පාදන කමිටු සහ තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජිකයින් නියමිත පරිදි ප්‍රතිඥා ලබා නොදීම, අවම මිල සහිත ලංසුව ඉදිරිපත් කළද කොන්ත්‍රාත්තුව ඉටු කිරීමට අවශ්‍ය හැකියාව සහ සම්පත් නොමැති ආයතන වෙත ලංසු ප්‍රදානය කිරීම , ලංසුකරු සමග අවබෝධතා ගිවිසුමක් ලියා අත්සන් කර නොගැනීම, කාර්ය සාධන

සුරක්ෂණ කාලය අවසන් වී තිබුණද එහි කාලය දීර්ඝ කර නොගැනීම වැනි අඩුපාඩු සිදුකර තිබුණි.

විගණනය වෙත ලබා දුන් තොරතුරු අනුව ඉහත මිලදීගත් ජල පොම්පවලින් රු.18,440,600 ක් වටිනා ජල පොම්ප 14 ක් 2023 ජනවාරි 25 වන විටත් අදාල ආයතන වෙතින් සැපයීම් කර නොතිබුණු අතර ප්‍රජා මූල සංවිධාන 2 කට ලබාදුන් රු.1,966,000 ක් වටිනා ජල පොම්ප 02 ක් වෙනුවෙන් රු.187,860 ක වැඩිපුර ගෙවීමක්ද කර තිබුණි.

(ඇ) දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ව්‍යාපෘතිවලට අදාලව සකස් කරනු ලබන ඉංජිනේරු ඇස්තමේන්තු වටිනාකම් පිලිබඳ නොසලකා ඉහල වටිනාකම්වලට කොන්ත්‍රාත් ප්‍රදානය කර තිබුණු අතර විගණන නියැදි පරීක්ෂාවට ලක් වූ මඩකලපුව ප්‍රදේශයේ ජල සම්පාදන ව්‍යාපෘති 5 කට අදාලව සහ මොණරාගල ජල සම්පාදන 04 කට ව්‍යාපෘති අදාලව ඉංජිනේරු ඇස්තමේන්තු වටිනාකම් ඉක්මවා සියයට ප්‍රදේශයේ 24 සිට සියයට 29 ක වැඩි වටිනාකමකට කොන්ත්‍රාත් පිරිනමා තිබූ අතර එසේ ඉක්මවීම් නිසා කොන්ත්‍රාත්තුවල මුළු පිරිවැය වැඩිවීම්වල එකතුව රු.14,463,172 ක් වී තිබුණි. ඒ අනුව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3 ඡේදයේ දක්වා ඇති උපදෙස් ප්‍රකාරව ඉංජිනේරු ඇස්තමේන්තු සකස් කිරීමෙන් අපේක්ෂා කරන අරමුණු ඉටු නොවන අතර ඒ සඳහා වැය කරන පිරිවැයද නිෂ්කාර්ය බවට පත්වී තිබුණි.

(ඈ) ප්‍රජා ජල අභිමානී වැඩසටහන යටතේ ප්‍රතිලාභී පවුල් 524 ක් ඉලක්ක කර ගනිමින් බදුලුගම්මන, බිබිල පානීය ජල ව්‍යාපෘතියේ දෙවන අදියර සඳහා රු.12,209,816 ක ඉංජිනේරු ඇස්තමේන්තුවක් සකස් කර තිබුණු අතර එහි ඇතුලත් ප්‍රධාන සිවිල් වැඩ 07 හි පිරිවැය හා සැසඳීමේදී තෝරාගත් කොන්ත්‍රාත්කරුගේ ඇස්තමේන්තුගත පිරිවැය අතර විචලතාවය සියයට 10 ඉක්මවා තිබූ කාර්යයන් 06 ක් පැවති අතර එම එක් එක් කාර්යයන් තුල ඇතුලත් අයිතමයන් වෙන් වෙන්ව සලකා බැලීමේදී විචලතාවය සියයට 587 ක් දක්වා වූ ඉහළ අසාමාන්‍ය අගයක් සහිත පරාසයක් ගෙන තිබූ බව තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව පරීක්ෂා කිරීමේදී අනාවරණය විය. ලංසු ඇගයීමේදී මෙම විචලතාවය නොසලකා තිබුණි.

3.3 අනාර්ථික ගනුදෙනු

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් සිදුකරනු ලැබේ.

(අ) මොණරාගල රනුගල්ල ප්‍රදේශයේ පවුල් 500 කට ජලය සැපයීමේ දෙවන අදියර යටතේ රු.1,665,984 ක ඇස්තමේන්තු පිරිවැයකට $60m^3$ ක ප්‍රමාණයේ ෙරොසිමෙන්ට් ජල ටැංකියක් ඉදිකිරීමට සැලසුම්කර තිබුණි. මෙම ජල ටැංකි ඉදිකිරීමට අදාල ඇස්තමේන්තු

පිරිවැය රු.1,665,984 ක් වුවත් කොන්ත්‍රාත් ප්‍රදානය රු.2,314,123 කට සිදුකර තිබුණු අතර ඒ සඳහා රු.462,824 ක් අත්තිකාරම් ගෙවා තිබුණි. එම ටැංකිය ඉදිකිරීමේදී තාක්ෂණික ගැටලු හදුනාගත් බවට හේතු දක්වමින් එය ඉදිකිරීම අත්හිටුවීමට 2021 නොවැම්බර් 17 දින ප්‍රසම්පාදන කමිටුව තීරණය කර තිබුණි. කෙසේ වුවද, මෙම ව්‍යාපෘතියෙහි මුල් අධියරයෙහි ඉදිකිරීම් සඳහා ඒ වන විට එකතුව රු.6,147,244 ක්ද වැයකර තිබුණද මේ දක්වා අපේක්ෂිත අරමුණ ඉටු නොවී පැවතුනි.

(ආ) මැණික්කඩවර ජල ව්‍යාපෘතිය සඳහා පෞද්ගලික ආයතනයකින් මිලදී ගත් රු.4,660,200 ක් පිරිවැයවූ ජල පොම්ප දෙකක් අදාල ව්‍යාපෘතියෙහි ස්ථාපිත නොකර අදාල ප්‍රජා මූල සංවිධානයේ ලේකම්ගේ නිවසේ තබා ඇති බව 2023 පෙබරවාරි 15 දින විගණනයට දන්වා තිබුණි. එම පිරිවැයෙහි ඇතුලත් ජල පොම්ප සවිකිරීම සඳහා වූ රු.120,000 ක මුදල ජල පොම්ප සවි කිරීමකින් තොරව 2021 වර්ෂයේ සැපයුම්කරු වෙත ගෙවා තිබුණි.

3.4 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම

2022 මාර්තු 22 දින නිකුත් කරන ලද අංක WAS/A/DNCWS/2022/AQ-04 දරන විගණන විමසුමට විගණන දිනය වූ 2023 මාර්තු 31 දින දක්වා පිළිතුරු ලබා දී නොතිබුණි.

3.5 කළමනාකරණ දුර්වලතා

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් සිදුකරනු ලැබේ.

(අ) නියැදි පරීක්ෂාවට භාජනය වූ 2020-2022 කාලපරිච්ඡේදය තුල දෙපාර්තමේන්තුව විසින් පෞද්ගලික කොන්ත්‍රාත් ආයතන 41 ක් වෙත එකතුව රු.1,180,611,356 ක් වූ කොන්ත්‍රාත් 160 ක් පිරිනමා තිබුණි. විගණිත දිනය වූ 2023 මාර්තු 29 දින වනවිට ඉන් කොන්ත්‍රාත් 04 ක පමනක් වැඩ නිමකර තිබුණි. වැඩ නිම නොකරන ලද කොන්ත්‍රාත් අතර 2021 වර්ෂයේ පිරිනැමූ කොන්ත්‍රාත් 153 ක් තිබුණි. ඉහත කී කොන්ත්‍රාත් ප්‍රදානය කල දිනය හා නිමකල යුතුව තිබූ දිනය පිළිබඳ තොරතුරු විගණනය විසින් ලිඛිතව ඉල්ලුම්කර තිබුණද එම තොරතුරු ඉදිරිපත් නොකෙරුණි. ඒ අනුව නියමිත කාලය තුල කොන්ත්‍රාත් නිමකර තිබේද යන්න සහ දින දීර්ඝ කිරීම් පිළිබඳ තොරතුරු වාර්තා කල නොහැකි විය. තවද, දෙපාර්තමේන්තුව විසින් ඉහත කී තොරතුරු ඇතුළත්ව කොන්ත්‍රාත් ලේඛනයක් නඩත්තු කිරීමටද කටයුතු කර නොතිබුණි.

(ආ) 2016 සැප්තැම්බර් 30 දිනැති අංක 04/2016 (i) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කොන්ත්‍රාත්කරුවන්ගේ ධාරිතාව අනුව කරන ලද වර්ගීකරණය සහ ලබාදිය හැකි මූල්‍ය

සීමාව නොසලකා එකම කොන්ත්‍රාත්කරු වෙත එකම දින එකම කාලපරිච්ඡේදයක් තුල නිම කිරීම සඳහා දෙපාර්තමේන්තුව විසින් කොන්ත්‍රාත් ප්‍රදානය කර තිබූ අතර නියැදි පරීක්ෂාවට ලක් වූ මඩකලපුව දිස්ත්‍රික්කයේ එකතුව රු.24,736,088 ක් වූ කොන්ත්‍රාත් කාර්යයන් 05 ක්ද අනුරාධපුර දිස්ත්‍රික්කයේ ජල ව්‍යාපෘති 4 ක එකතුව රු.59,274,662 ක කොන්ත්‍රාත් කාර්යයන්ද එසේ සීමාව ඉක්මවා කොන්ත්‍රාත් පිරිනමා තිබූ අතර විගණනයට ඉදිරිපත්කල තොරතුරු අනුව කොන්ත්‍රාත්කරුවන් 4 දෙනෙකු වෙත එසේ සීමාව ඉක්මවා රු. 145,381,300 ක කොන්ත්‍රාත් පිරිනමා තිබුණු බව තවදුරටත් අනාවරණය විය. මෙම වාර්තාවේ 3.1.2, 3.1.3, 3.1.4 ඡේදවල විස්තර කර ඇති පරිදි ජල සම්පාදන ව්‍යාපෘති නිමකිරීම අසාමාන්‍ය ලෙස ප්‍රමාදවීමට සහ නිසි ප්‍රමිතියකින් යුතුව කොන්ත්‍රාත් නිමනොකිරීමට මෙම තත්ත්වයද සෘජුලෙස බලපා තිබුණි.

(ඇ) දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලද සහ සමාලෝචිත වර්ෂයේ විගණන නියැදි පරීක්ෂාවට ලක් වූ ජල සම්පාදන ව්‍යාපෘතිවලට අදාලව විධිමත් ප්‍රසම්පාදන ක්‍රමවේදයක් මත කොන්ත්‍රාත්කරුවන් තෝරා නොගැනීම, ඇස්තමේන්තු පිරිවැය ඉක්මවා අධික මිලට කොන්ත්‍රාත් පිරිනැමීම, නොකල වැඩ සඳහා ගෙවීම් කිරීම, කොන්ත්‍රාත් නිසිපරිදි අධීක්ෂණය නොකිරීම, නිසිපරිදි ලේඛණ පවත්වාගෙන නොයෑම, කොන්ත්‍රාත් අතරමග අත්හැර දැමීම පිළිබඳ අවශ්‍ය ක්‍රියාමාර්ග නොගැනීම, ව්‍යාපෘති ආරම්භ කිරීමේ අරමුණු ඉටුවීම පිළිබඳ පසුවිපරම් නොකිරීම වැනි කොන්ත්‍රාත් පරිපාලනය සම්බන්ධයෙන් වූ පොදු අඩුපාඩු පිළිබඳ විගණන වාර්තා මගින් කළමණාකරනය දැනුවත්කර තිබුණද එම තත්ත්වය නිවැරදි කර ගැනීමට සමාලෝචිත වර්ෂය නිමවන විටත් දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

(ඈ) "ප්‍රජා ජල අභිමානී" මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව ප්‍රසම්පාදනයන් සිදු කිරීමට පෙර ප්‍රසම්පාදන අස්තිත්වය විසින් ඉඩම් අත්කර ගැනීමේ කටයුතු සම්පූර්ණ කර ඇති බව සහ ව්‍යාපෘතිය බාධාවකින් තොරව ක්‍රියාත්මතක කිරීම සඳහා අවශ්‍ය වෙනත් සියළු කරුණු ඉටුකර ඇති බව සනාථ කළ යුතු වුවත් දෙපාර්තමේන්තුව විසින් ආරම්භ කරන ලද විගණන නියැදි පරීක්ෂාවට භාජනය වූ මඩකලපුව හා අනුරාධපුර දිස්ත්‍රික්වල ජල ව්‍යාපෘති 07 කට අදාල ඉදිකිරීම් භූමි අත්පත් කර ගෙන නොතිබුණි.

4 යහපාලනය

4.1 මහජනයා වෙත සේවා ඉටු කිරීම

සුරක්ෂිත පානීය ජල අවශ්‍යතාවය මත ප්‍රජා ජල යෝජනාක්‍රමයක් ස්ථාපිත කරවා ගැනීමේ අරමුණෙන් ජල මූලාශ්‍රයක් හදුනාගෙන ආරම්භකර තිබූ ප්‍රජා මූල සංවිධාන 335 ක් සමාලෝචිත

වර්ෂය නිමවන විට අක්‍රීයව පවතින බව වාර්තා වී තිබුණු අතර ඉන් ප්‍රජා මූල සංවිධාන 299 ක් දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි වූ සංවිධාන වී තිබුණි. විගණනයට ලබාදුන් තොරතුරු අනුව ඉන් 101 ක් පමණක් ජල සම්පාදන මණ්ඩලය යටතේ ආවරණය වූ ප්‍රදේශ වීම නිසා අක්‍රිය වී තිබුණි. ජල මූලාශ්‍රයේ නුසුදුසුභාවය, තාක්ෂණික දෝෂ ,කළමනාකරණ දුර්වලතා, දේශපාලන හා වෙනත් හේතු මතද සංවිධාන 234 ක් අක්‍රීයව පැවතුණි. එමෙන්ම දෙපාර්තමේන්තුව විසින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට ගොස් පැනනැගුණු විවිධ හේතු මත අත්හැර තිබූ ව්‍යාපෘති සංඛ්‍යාව 64 ක් ඒ අතර විය. ඉහත සඳහන් කළ පරිදි කුමන හෝ හේතුවක් මත එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම තුල එම ප්‍රදේශවල ජනතාවගේ සුරක්ෂිත පානීය ජල අවශ්‍යතාව සපුරාලීමට නොහැකි වී තිබුණි.

4.2 අභ්‍යන්තර විගණනය

2018 අංක 19 දරන ජාතික විගණන පනත් 40(1) වන වගන්තිය ප්‍රකාරව සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයෙ මුදල් රෙගුලාසි සංග්‍රහයේ රෙගුලාසි අංක 128 (අ, ආ) සහ 133 ප්‍රකාරව ප්‍රධාන ගණන් දීමේ නිළධාරීගේ රාජකාරි හා වගකීම ඉටුකිරීමේ දී ශක්තිමත් අභ්‍යන්තර පාලන ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම සඳහා විගණන අංශයක් පිහිටුවිය යුතු අතර ජාතික විගණන පනතේ 41 වගන්තියෙහි ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් නිසි පරිදි පැවැත්විය යුතුයි. කෙසේ වුවද, දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය තුල අභ්‍යන්තර විගණන තනතුර අනුමත කර තිබුණද, එම තනතුරට අදාල බදවා ගැනීම් සිදුකර ගනිමින් දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය සහ ඵලදායිතාවය ඉහළ මට්ටමක පවත්වාගෙන යාම සඳහා අභ්‍යන්තර විගණන ඒකකය ස්ථාපිත කොට එය ක්‍රියාකාරී ලෙස පවත්වාගෙන යාම සඳහා සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් කටයුතු කර නොතිබුණි.

5. මානව සම්පත් කළමනාකරණය

5.1 අනුමත කාර්ය මණ්ඩලය, කථ්‍ය කාර්ය මණ්ඩලය

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ අනුමත, කථ්‍ය, පුරප්පාඩු හා අතිරික්ත කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

සේවක කාණ්ඩය	අනුමත සේවක සංඛ්‍යාව	තත්‍ය සේවක සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව	අතිරික්ත සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ මට්ටම	36	22	15	01
තෘතියික මට්ටම	01	-	01	-
ද්විතියික මට්ටම	404	407	68	71
ප්‍රාථමික මට්ටම	70	37	33	-
එකතුව	511	466	117	72

ජ්‍යෙෂ්ඨ මට්ටමේ අනුමත තනතුරු 36 න් තනතුරු 15 ක් ඇතුලුව සියළුම කාණ්ඩවල පුරප්පාඩු සංඛ්‍යාව සියයට 23 ක පමණ ප්‍රතිශතයක් විය. කෙසේ වුවද සේවකයින් 72 ක අතිරික්තයක්ද නිරීක්ෂණය වූ අතර සේවක කළමණාකරනයේ ඉතාම දුර්වල තත්වයක් මේ තුලින් නිරීක්ෂණය විය.

එම්.ඒ.එස්.පුෂ්පරාණි
ජ්‍යෙෂ්ඨ **සහකාර විගණකාධිපති**
විගණකාධිපති වෙනුවට.